පාලි යතුර

04 ශ්‍රේණිය

රාජකීය පණ්ඩිත පදියතලාවේ ඤාණවිමල හිමි

මො / ශ්‍රී විද්‍යානන්ද පිරිවෙණ
යල්කුඹුර - බිබිල

077 8438417
070 6438417

WWW.PIRIVENA.LK

වචනයක්..................

මූලික පිරිවෙන් සිවුවැනි ශ්‍රේණියේ අධ්‍යාපන හදාරන සිසු දරුවන් වෙනුවෙන් පාලි පෙළ පොතේ පාඩම් සඳහා සකස් කළ පිළිතුර පොත 'පාලි යතුර - 04' ලෙසින් ඔබ අතට මෙලෙසින් පත් කෙරේ. වර්තමානයේ පැන නැගී ඇති කොවිඩ් වසංගතය හේතුවෙන් සිසු දරුවන්, ගරුභවතුන් දැඩි අසීරුතාවලට ලක් වී ඇති බව අමුතුවෙන් කිව යුත්තක් නොවේ. පෙළ පොත ඇසුරු කර පාඩම් අධ්‍යයනය කරන සිසුන්ට අදාළ අභ්‍යාස සඳහා පිළිතුරු ලියා එය පරීක්ෂා කර බැලීමේ අවස්ථාවක් ලබා දීම මෙම පොත රචනයේ අපේක්ෂාවයි.

මෙම පොතෙහි අකුරු 87000කට අධික ය. වචන 18000කට ආසන්න ය. අකුරක් පාසා ඇත්තේ වෙහෙස මහන්සිය යි. මෙය මාසයක පමණ කැපවීමේ ප්‍රතිඵලයකි. එබැවින් මෙයින් උපරිම ප්‍රයෝජන සිසුන් ලබා ගනු දැකීම රිසි වෙමි. මෙහි අක්ෂර දෝෂ තිබිය හැකි ය. එවැනි තැන් ඇතොත් නිවැරදි කර සිසුන් වෙත යොමු කිරීම ගුරුභවතුන්ගේ වගකීමකි. පාලි භාෂාවෙන් ව්‍යක්ත පරපුරක් බිහි වනු දැකීම ඒකායන ප්‍රාර්ථනාවයි.

තෙරුවන් සරණයි.

පදියතලාවේ ඤාණවිමල හිමි
පරිවෙණාධිපති

මො / ශ්‍රී විද්‍යානන්ද පිරිවෙණ
යල්කුඹුර, බිබිල

2021. ජුනි. 24 (පොසොන් පොහෝ දින)

077 84 38 417
072 24 38 417
070 64 38 417

WWW.PIRIVENA.LK

පිදුම

අකුරෙන් අකුර

ගළපා කියාදුන්

ළබැඳි, උත්තුංග

ඇදුරු පියවරුන්ට

WWW.PIRIVENA.LK

පළමු පාඩම

නමාමි සත්ථාරමනන්තගොචරං

අභ්‍යාසය

- ගාථා පරිවර්තනය

නමාමි සත්ථාරමනන්තගොචරං - අපරිමිත විෂයය ඇති ශාස්තෘන් වහන්සේ නමස්කාර කරමි.

විසාරදං වාදපථාතිවත්තිනං
තිලොකපජ්ජොතමසය්හසාහිනං
අසෙසඤ්ඤෙය්‍යාවරණප්පහායිනං
නමාමි සත්ථාරමනන්තගොචරං

විශාරද වූ, වාද මාර්ග ඉක්ම වූ, තුන් ලොවට පහනක් වූ, ඉවසිය නොහැකි දෑ ඉවසන, ඥාණ මණ්ඩලයට ආවරණ විද්වංසනය කළා වූ, අපරිමිත විෂය පථ ඇති ශාස්තෘන් වහන්සේට නමස්කාර කරමි.

තිලොකනාථප්පභවං භයාපහං
විසුද්ධවිජ්ජාචරණෙහි සෙවිතං
පපඤ්චසඤ්ඤොජනබන්ධනච්ඡිදං
නමාමි ධම්මං නිපුණං සුදුද්දසං

තුන්ලොවට පිහිට වූ බුදුරජාණන් වහන්සේගෙන් උපන්, භීතිය පහකරන පිරිසිදු විජ්ජාචරණ ගුණයෙන් යුතු අය විසින් සේවනය කරන ලද තණ්හා මාන දිට්ඨි හා සංයෝජන ධර්ම බැඳුම් නසාලන සියුම් වූ, දැකීමට අතිශයින් අපහසු වූ නවලොව්තුරා ධර්ම රත්නය නමස්කාර කරමි.

පසාදමත්තෙන'පි යත්ථ පාණිනො
ඵුසන්ති දුක්ඛක්ඛයමච්චුතං පදං
තමාහුණෙය්‍යං සුසමාහිතින්ද්‍රියං
නමාමි සඞ්ඝං මුනිරාජසාවකං

WWW.PIRIVENA.LK

සත්ත්වයන් යම් සංඝරත්නයක් කෙරෙහි පැහැදීම් මාත්‍රයකින් දුක් නැතිකරන නිවන ස්පර්ශ කෙරෙත් ද දුර බැහැර සිට ගෙනෙන දෑ දීමට සුදුසු වන්නෝ ද මනා ඉන්ද්‍රිය දමනයෙන් යුතු බුදුරදුන්ගේ ශ්‍රාවකයන් වූ සංඝරත්නය නමස්කාර කරමි.

1. පහත ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. පඨමාය ගාථාය දාඨාවංසකත්තා කං නමස්සති ?

පඨමාය ගාථාය දාඨාවංසකත්තා බුද්ධං නමස්සති.

ii. දුතියාය ගාථාය කත්තා ධම්මස්ස කති ගුණානි දස්සෙති ? තානි උද්ධරිත්වා දස්සෙතු.

දුතියාය ගාථාය කත්තා ධම්මස්ස පඤ්චගුණානි දස්සෙති.

තිලොක නාථප්පභවං, භයාපහං, පපඤ්ච, සඞ්ඛ්‍යාජනබන්ධනච්ඡිදං, නිපුනං

iii. ධම්මො කෙහි සෙවිතො හොති ?

ධම්මො විසුද්ධ විජ්ජාචරණෙහි සෙවිතො හොති.

iv. පාණිනො කානි ඵුසන්ති ?

ඵාණිනො අච්චුතං පදං ඵුසන්ති.

v. කෙ සුසමාහිතින්ද්‍රියා ආහුණෙය්‍යා භවන්ති ?

මුනිරාජසාවකා සුසමාහිතින්ද්‍රියා ආහුණෙය්‍යා භවන්ති

2. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. බුදුරදුන් පිළිබඳ මෙහි දක්වා ඇති විශේෂ ගුණ මොනවා ද?

- විශාරදත්වයෙන් යුක්ත ය.
- වාද මාර්ගයන් ඉක්මවන සුලු ය.
- තුන ලොවට පහනක බඳු ය.
- ඉවසිය නොහැකි දෑ ඉවසන සේක.
- පාපධර්මයන් ප්‍රහාණය කර ඇත.
- විජ්ජාචරණාදි ලෝකවිදූ ගුණයෙන් යුක්ත ය.

WWW.PIRIVENA.LK

ii. සංයෝජන ධර්ම නම් කරන්න.

- සක්කාය දිට්ඨි
- විචිකිච්ඡා
- සීලබ්බත පරාමාස
- කාමරාග
- ව්‍යාපාද
- රූපරාග
- අරූපරාග
- මාන
- උද්ධච්ච
- අවිජ්ජා

iii. ඉන්ද්‍රිය සංවර කළෝ කවරහු ද?

මහා සංඝරත්නය

iv. තුන්ලොව නම් කරන්න.

- කාමලෝක
- රූප ලෝක
- අරූප ලෝක

v. තෙවන ගාථාවෙහි එන සඟ ගුණ කවරේ ද?

- ආහුණෙය්‍යය ගුණය
- මනා ඉඳුරන් දමනය කළ ගුණය
- ප්‍රසාද මාත්‍රයකිනුදු ප්‍රාණීන්ගේ දුක නැතිකරන සුලු

අභ්‍යාසය

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් අනුව ස්වර පිළිබඳ වෙනස දක්වන්න.

WWW.PIRIVENA.LK

පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් (ලංකාවේ) තුනක් පිළිබඳ දැක්වේ. මෙහි කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදාය හා මොග්ගල්ලාන ව්‍යාකරණ සම්ප්‍රදාය අක්ෂර මාලාවේ ස්වර සම්බන්ධයෙන් දක්වා ඇත්තේ පරස්පර අදහස් ය.

කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදාය ස්වර අක්ෂර 8ක් ඇති බව දක්වයි.

එනම් අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ

මෙහි එ, ඔ හල් සලකුණ සහිතව ලීව ද සැබැවින්ම එය උච්චාරණයේ දී දීර්ඝ ලෙස උච්චාරණය කෙරේ.

එහෙත් මොග්ගල්ලාන ව්‍යාකරණ සම්ප්‍රදාය මගින් ස්වර අක්ෂර 10ක් දක්වා ඇත.

අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ

ලෙස ය. කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායේ හ්‍රස්ව එ, ඔ නොමැති වුණත් එය උච්චාරණයේ දී ශබ්ද කළ හැකි අවස්ථාවක් දැක්වේ. එනම් බැඳි අකුරකට මුලින් මෙම අක්ෂර දෙක පිහිටි විට ය.

මෙම විෂමතා කච්චායන හා මොග්ගල්ලාන ව්‍යාකරණ සම්ප්‍රදාය දෙකෙහි විද්‍යමාන වේ.

- කච්චායන ස්වර 08
- මොග්ගල්ලාන ස්වර 10

ii. පහත වචන අකාරාදි පිළිවෙළට ලියන්න.

මාසෙ, රමෙම, ලංකා, සුගතො, උපාගතො, සිරොපරි, ඨානං, විසොධෙතුං, එකයොජන, ගංගාතීරෙ

i. උපාගතො
ii. එකයොජන
iii. ගංගාතීරෙ
iv. ඨානං
v. මාසෙ
vi. රමෙම
vii. ලංකා

WWW.PIRIVENA.LK

viii. විසොධෙතුං

ix. සිරොපරි

x. සුගතො

iii. ඝෝෂ හා අඝෝෂ භේදය පැහැදිලි කරන්න.

උච්චාරණයේ දී වැඩි හඬක් සහිතව එකී කාර්යය කරන්නේ ඝෝෂාක්ෂරවල දී ය. එම අකුරු 21කි.

වර්ගාක්ෂරවල තෙවැනි සිව්වැනි පස්වැනි අක්ෂරත් අන්තස්ථාක්ෂරත් හ, ළ අක්ෂරත් ඝොෂ වේ.

ග, ඝ, ඞ

ජ, ඣ, ඤ

ඩ, ඪ, ණ

ද, ධ, න

බ, භ, ම

ය, ර, ල, ව

හ, ළ

අඝෝෂාක්ෂර 11කි. උච්චාරණයේ දී අඩු හඬකින් උච්චාරණය සිදු වීම මෙහි විශේෂත්වයයි.

ක, ඛ, ච, ඡ, ට, ඨ, ත, ථ, ප, ඵ, ස එකී අක්ෂරයි.

iv. උප්පත්ති ස්ථාන අනුව වර්ණමාලාව ප්‍රභේද කර දක්වන්න.

උත්පත්ති ස්ථානය	**බාලාවතාර පාඨය**	**අක්ෂර**
බොටුව	අකවග්ගහා කණ්ඨජා	අ,ආ, ක, ඛ, ග, ඝ, ඞ, හ
තල්ලා	ඉචවග්ගයා තාලුජා	ඉ, ඊ, ච, ඡ, ජ, ඣ, ඤ, ය
තොල්	උපවග්ගා ඔට්ඨජා	උ, ඌ, ප, ඵ, බ, භ, ම
දත්	තවග්ගලසා දන්තජා	ත, ථ, ද, ධ, න, ල, ස

WWW.PIRIVENA.LK

මුදුන	ටවගගරළා මුද්ධජා	ට, ඨ, ඩ, ඪ, ණ, ර, ළ
බොටුව හා තල්ල	එකණ්ඨතාලුජො	එ
බොටුව හා තොල්	ඔකණ්ඨොට්ඨජො	ඔ
දත් හා තොල්	වොදන්තොට්ඨජො	ව

2. පහත ගාථා පාඨ නිවැරදි ව ලියන්න.

i. කායොචිගුච්ජො සකලො සුගන්ධො

කායොජිගුච්ඡො සකලො දුගන්ධො

ii. එත්තාවතාව අමෙමහි

එත්තාවතා ච අමෙහහි

iii. එතං කුසුම සනොතාසිං

එතං කුසුම සන්තතිං

iv. ඉචචිතං පචචිතං

ඉච්ඡිතං පත්ථිතං

v. අජ්ජයං කම මෙ හනෙත

අච්චයං ඛම මෙ භන්තෙ

3. පහත සූත්‍රවල සිංහල තේරුම ලියන්න.

i. අං ඉති නිගගහීතං

අං යනු නිග්ගහීතය යි.

ii. ළනතාකෙඛරාසො සොසා

ළකාරයෙන් අවසන් කොට ඇති අවශේෂ අකුරු සෝෂ යි.

iii. වගගානං පඨමදුතියා සොචාසොසා

වර්ගයන්ගේ පළමු දෙවැනි හා සකාරය අඝෝෂ වේ.

WWW.PIRIVENA.LK

iv. තයෝොදනතා සරා අටඨ
එහි ඔ අන්තකොට ඇති අකුරු අට ස්වර වේ.

v. අකඛරාපාදයො එකචතතාළීසං
අකාරයේ පටන් අක්ෂර හතළිස් එකකි.

4. පහත සඳහන් වචනවල අක්ෂර වින්‍යාසය නිවැරදිව ලියන්න.

i. අනනො - අනණො
ii. බබුව - බහුව
iii. සුබිසත්තා සුඛිතතතා
iv. සඨසහස්ස - සතසහසස
v. විඤ්ඤොහී'ති - විඤ්ඤූහී'ති
vi. විරත්ඨචිත්තා - විරතතචිතතා
vii. සත්ථා සදාහන්තු - සතතා සදාහොනතු
viii. සත්තාරො - සතථාරො
ix. පුරිසධම්මසාරති - පුරිසදමමසාරථී
x. විබූසයං - විභූසයං

i. සිථිල හා ධනිත අකුරු වෙන වෙන ම ලියන්න.
සිථිල අකුරු - ක, ච, ට, ත, ප, ග, ජ, ඩ, ද, බ
ධනිත අකුරු - ඛ, ඡ, ඨ, ථ, ඵ, ඝ, ඣ, ඪ, ධ, භ

ii. 'ඉච වගගයා තාලුජා' යනු කුමන අකුරු දැයි ලියන්න.
තල්ලෙන් උපදින අකුරු වේ. එනම් ඉ ඊ ච ඡ ජ ඣ ඤ ය අකුරුයි.

iii. බින්දුව පුරාණ පොත්වල ලියා ඇති අයුරු දැක්වෙන බාලාවතාර ඉගැන්වීම් කුමක් ද?
බිඤ්චූළාමනාකාරො නිගගහීතනති වුචචතෙ
කෙවලසසපපයොගතතා අකාරො සනනිධීයතෙ

WWW.PIRIVENA.LK

iv. නාසිකාක්ෂර ලියා ඒවාට එසේ පවසන්නේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න.

ඞ, ඤ, ණ, න, ම

මේවා නාසයෙහි ආධාරය ඇති ව උච්චාරණය වන අක්ෂර බැවිනි.

v. ලංකාවේ ජනප්‍රිය වූ පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් දක්වා ඒවාට අදාළ ප්‍රකට ග්‍රන්ථ ලියා දක්වන්න.

කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදාය - බාලාවතාරය, රූපසිද්ධිය, ධාතුමඤ්ජුසාව

මොග්ගල්ලාන ව්‍යාකරණ සම්ප්‍රදාය - පදසාධනය, පයොගසිද්ධි

සද්දනීති ව්‍යාකරණ සම්ප්‍රදාය

WWW.PIRIVENA.LK

දෙවැනි පාඩම

දානං සග්ගස්ස සොපාණං - දානය ස්වර්ගයට ඉණිමඟකි.

අභ්‍යාසය

01. 'දානං සග්ගස්ස සොපාණං' යන ඡේදය සිංහලට නගන්න.

- ❖ අම්හාකං භගවති පරිනිබ්බුතෙ පාටලීපුත්ත සමීපෙ අඤ්ඤතරස්මිං ගාමෙ අඤ්ඤතරො දුග්ගතමනුස්සො වසති.

  අපගේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවූ කල්හි පැළලුප්නුවර සමීපයෙහි එක්තරා ගමක එක්තරා දුගී මිනිසෙක් වාසය කරයි.

- ❖ සො පනෙකදිවසං අඤ්ඤතරං ගාමං ගච්ඡන්තො දෙව සාටකෙ නිවාසෙත්වා මහන්තං අටවිං පාපුණි.

  ඔහු (වනාහි) එක්දිනක් එක්තරා ගමකට යන්නේ සළු දෙකක් හැඳ මහා කැලයකට පැමිණියේ ය.

- ❖ තදෙවං දිස්වා එතස්ස වත්ථං ගණ්හිස්සාමීති එකො චොරො අනුබන්ධි.

  මොහු මෙසේ යනු දැක මොහුගේ වස්ත්‍රය ගනිමියි එක් සොරෙක් ලුහුබැන්දේ ය.

- ❖ සො දූරතොව ආගච්ඡන්තං චොරං දිස්වා චින්තෙසි.

  ඔහු දුරසිටම එන සොරා දැක සිතුවේ ය.

- ❖ අහමෙතස්මා පලායිතුං වා තෙන සද්ධිං යුජ්ඣිතුං වා න සක්කොමි අයමාගන්ත්වා අවස්සං අනිච්ඡන්තස්සාපි මෙ වත්ථං ගණ්හිස්සති.

  මම මොහුගෙන් පළායාමට හෝ මොහු සමග යුද්ධ කිරීමට හෝ නොහැක්කෙමි. මොහු අවුත් අනිවාර්යයෙන්ම නොකැමතිවුවත් මගේ වස්ත්‍රය ගන්නේය.

WWW.PIRIVENA.LK

❖ මයාපිසස නිරත්‍ථකෙන හරිතුං න සක්කා දානවසෙනසස දස්සාමීති සන්නිට්ඨානමකාසි.

මා විසින් ද මොහුට අප්‍රයෝජන වශයෙන් අත්හරින්නට නොහැකිය. ඔහුට දන් වශයෙන් දෙමියි ස්ථිර කරගත්තේ ය.

❖ අථ චොරො ආගන්ත්වා වත්‍ථකං පරාමසි.

ඉක්බිති සොරා පැමිණ වස්ත්‍රය අතගෑවේ ය.

❖ අථ සො පුරිසො චිත්තං පසාදෙත්වා ඉමං මම වත්‍ථදානං භවභොගසුඛත්‍ථාය පච්චයො හොතූති වත්‍ථං දත්වා දුච්ඡාදිතත්තා මහාමග්ගං පහාය අඤ්ඤෙන ජංඝාමග්ගෙන ගච්ඡන්තො ආසිවිසෙන දට්ඨො කාලං කත්වා හිමවන්තප්පදෙසෙ ද්වාදසයොජනිකෙ කණකවිමානෙ නෙකච්ඡරාසහස්සපරිවුතො නිබ්බත්ති.

ඉක්බිති ඒ පුරුෂයා සිත පහදා මේ මගේ වස්ත්‍රදානය භවභෝග සැප පිණිස ප්‍රත්‍යක්ෂ වේවායි වස්ත්‍රය දී සුදුසු වස්ත්‍ර නොමැත්තෙන් මහමඟ හැර කැලෑ පාරකින් යන්නේ සර්පයෙකු විසින් දෂ්ට කරනු ලැබුවේ කළුරිය කොට හිමවතෙහි දොළොස් යොදුන් රන් විමනක නොයෙක් සිය ගණන් අප්සරාවන් පිරිවරන ලද්දේ උපන්නේ ය.

❖ විමානං පනස්ස පරිවාරෙත්වා තියොජනිකෙ ඨානෙ කප්පරුක්ඛා නිබ්බත්තිංසු.

ඔහුගේ විමානය පිරිවරා තුන්යොදුන් තැන කප්රුක් උපන්නේ ය.

❖ සො මහන්තං දිබ්බසම්පත්තිං දිස්වා සොමනස්සං පවෙදෙන්තො ආහ.

ඔහු මහත් වූ දිව්‍ය සම්පත් දැක සතුට ප්‍රකාශ කරමින් මෙසේ කීවේ ය.

WWW.PIRIVENA.LK

❖ පරිණාමිතමත්තෙන දානස්ස සකසන්තකං
 දදාති විපුලං භොගං දිබ්බමිස්සරියං වරං
 තමා අයත් වස්තුව දානය පිණිස පිරිනැමූ පමණින් මහත් වූ සම්පත් හා උතුම් දෙව් සැපත් ද දෙයි.

02. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. දුග්ගතමනුස්සො කස්මිං ගාමෙ වසති ?

 දුග්ගතමනුස්සො පාටලීපුත්තසමීපෙ අඤ්ඤතරස්මිං ගාමෙ වසති.

ii. ගාමං ගච්ඡන්තො සො කිත්තකානි වත්ථානි පාරුපි ?

 ගාමං ගච්ඡන්තො සො ද්වෙ සාටකෙ පාරුපි.

iii. එකො චොරො කිමත්ථාය තං අනුබන්ධි ?

 එකො චොරො වත්ථං ගණ්හිතුං තං අනුබන්ධි.

iv. චොරං දිස්වා සො කිං චින්තෙසි ?

 චොරං දිස්වා සො අහමෙතස්මා පලායිතුං වා තෙන සද්ධිං යුජ්ඣිතුං වා න සක්කොමී'ති චින්තෙසි.

v. කාලකතො සො කත්ථ නිබ්බත්ති ?

 කාලකතො සො හිමවන්තප්පදෙසෙ කනකවිමානෙ නිබ්බත්ති.

03. පිළිතුරු සපයන්න.

i. පාටලීපුත්‍ර නගරය සම්බන්ධ ඓතිහාසික ශාසනික සිද්ධියක් නම් කරන්න.

 තෘතීය ධර්ම සංගායනාව සිදු කිරීම

ii. බුදුදහම අනුව දුප්පත්ව ඉපදීමට හේතු කවරේ ද?

 පරිත්‍යාග නොකිරීම නිසා දන් නොදීම නිසා

iii. බුදුරදුන් වදාළ පරිදි වස්ත්‍ර දැරීමේ ප්‍රයෝජන මොනවා ද?

 සීතල නැසීම පිණිස, උෂ්ණ නසනු පිණිස, මැසි මදුරුවන්ගෙන් හා වෙනත් කෘමීන්ගෙන් ආරක්ෂා වීම

WWW.PIRIVENA.LK

පිණිස, අව්ව ආදි ස්වාභාවික ව්‍යසනයන්ගෙන් මිදීම පිණිස, රහස් ඉන්ද්‍රියන් ආවරණය කරගැනීම පිණිස

iv. අල්ප දෙයක් දන් දී මහේශාක්‍ය සම්පත් විඳි තවත් චරිත දෙකක් නම් කරන්න.

එකසාටක බමුණා

මහදුගියා

v. මෙම කථා පුවතින් ගතහැකි ජීවිතාදර්ශ දෙකක් ලියන්න.

දුප්පත් වුවත් දන් දීම පරිත්‍යාගය ඉතා වැදගත් වේ.

ස්ථානෝචිත ප්‍රඥාව

ඉවසන සුලු බව

04. මුල් පාලි ඡේදයේ වාක්‍ය රීතිය අනුගමනය කරමින් පහත ඡේදය පාලියට නගන්න.

- පෙර ලක්දිව අනුරාධපුරයේ මහවැව නම් ගමක් විය.

  පුබ්බෙ ලංකාදීපෙ අනුරාධපුර නගරෙ මහාවාපි නාම ගාමං අහොසි.

- එහි වෙසෙන එක්තරා දුප්පත් ගොවියෙක් දිනපතා කුඹුරට යන්නේ බත් මුලක් රැගෙන යයි.

  තත්ථ වසන්තං එකො දුග්ගත කස්සකො පතිදිනං ඛෙත්තං ගච්ඡන්තො භත්තපුටං ආදාය ගච්ඡති.

- ඉක්බිති එක් දවසක් එක් මගියෙක් දුර දීම ඔහු දැක බත්මුල ඉල්ලන්නට ඔහු ලුහුබැන්දේ ය.

  අථ එකස්මිං දිවසෙ එකො අද්ධිකො දූරතොව තං දිස්වා භත්තපුටං යාචිතුං තං අනුබන්ධි.

- මොහු අවුත් අනිවාර්යයෙන් මාගේ බත්මුල ඉල්ලන්නේ ය. මම දානයක් ලෙස මොහුට මෙය දෙන්නෙමි යි සිතී ය.

  තං ආගන්ත්වා අවස්සං මයා භත්තපුටං යාචිස්සති. අහං දානවසෙනස්ස අස්ස ඉදං දස්සාමීති චින්තෙසි.

- ඉක්බිති ඒ ගොවියා සිත පහදාගෙන මේ දානය සැප පිණිය වේවායි දන් දී යන්නේ අතරමග දී සර්පයෙකු

WWW.PIRIVENA.LK

විසින් දෂ්ට කරන ලද්දේ කළුරිය කොට දිව්‍ය ලෝකයේ උපන්නේ ය.

අථ සො කස්සකො චිත්තං පසාදෙත්වා ඉමං දානං සුඛත්ථාය පච්චයො හොතූති දානං දත්වා ගච්ඡන්තො අන්තරාමග්ගෙ ආසිවිසෙන දට්ඨො කාලං කත්වා දිබ්බවිමානෙ නිබ්බත්ති.

අභ්‍යාසය

01. සිංහලට නගන්න.

i. සුද්ධොදනමහාරාජා කපිලවත්ථුපුරෙ වසි.

සුද්ධෝදන මහරජතුමා කපිලවත්ථුපුරයේ විසුවේ ය.

ii. මහාමායාදෙවි කාලං කත්වා තුසිතපුරෙ නිබ්බත්ති.

මහාමායා දේවිය කළුරිය කොට තුසිතපුරයෙහි උපන්නී ය.

iii. රාහුලකුමාරො දහරකාලෙයෙව අරහත්තං පාපුණි.

රාහුල කුමාරයා ළමා කාලයේම රහත් බවට පැමිණියේ ය.

iv. සිද්ධත්ථකුමාරො ඡ වස්සං දුක්කරකිරියං අකාසි.

සිද්ධාර්ථ කුමාරයා සය වසක් දුෂ්කර ක්‍රියාව කළේ ය.

v. භගවා බාරාණසියං ඉසිපතනෙ අනුත්තරං ධම්මචක්කං පවත්තෙසි.

භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර ඉසිපතනයෙහි උතුම් වූ දම්සක් පැවතුම පැවැත්වූ සේක.

02. සිංහලට නගන්න.

i. භගවා පඤ්ඤාවන්තානං ධම්මං දෙසෙසි.

භාග්‍යවතුන් වහන්සේ ප්‍රඥාවන්තයන්ට ධර්මය දේශනා කළ සේක.

ii. සුතවා අරියසාවකො සීලවන්තීනං උපාසිකානං අභිධම්මකථං කථෙසි.

උගත් ආර්ය ශ්‍රාවකයා සිල්වත් උපාසිකාවන්ට අභිධර්ම කථාවක් කීවේ ය.

WWW.PIRIVENA.LK

iii. බන්ධුමා යසවන්තං සෙට්ඨිං උපසංකමිත්වා ධීතරං යාචි.

නෑයන් ඇත්තා යසසින් යුතු සිටුවරයා වෙත පැමිණ දියණිය ඉල්ලී ය.

iv. ථාමවන්තා කුමාරා ඵලවන්තං රුක්ඛං ආරුහිංසු.

බලය ඇති කුමාරවරු ගෙඩි ඇති ගසට නැග්ගා හ.

v. බලවා පුරිසො වෙගෙන ගන්ත්වා ධජං ගණ්හි.

බලය ඇති මිනිසා වේගයෙන් ගොස් ධජය ගත්තේ ය.

03. පහත නාම පදයන්හි විභක්තිය හා වචනය ලියන්න.

i. භගවති - සත්තමී, එක

ii. අඤ්ඤතරස්මිං - සත්තමී, එක

iii. ගච්ඡන්තානං - ඡට්ඨී, බහු

iv. අටවිං - පඨමා, දුතියා, එක

v. වත්ථං - පඨමා/දුතියා, එක

vi. අහං - පඨමා, එක

vii. චිත්තෙන - තතියා/කරණ, එක

viii. අඤ්ඤෙන - තතියා/කරණ, එක

ix. මග්ගෙන - තතියා, එක

x. විමානෙ - සත්තමී, එක

04. ධනවන්තු ශබ්දය පුල්ලිංගයේ සියලු විභක්තිවල වරනගා අර්ථය ද ලියන්න.

විභක්ති	එකවචන	බහුවචන
පඨමා	ධනවා, ධනවන්තො	ධනවන්තො, ධනවන්තා
ආලපන	(හෙ) ධනවං, ධනව, ධනවා	(භවන්තො) ධනවන්තො, ධනවන්තා
දුතියා	ධනවන්තං	ධනවන්තෙ
තතියා	ධනවතා, ධනවන්තෙන	ධනවන්තෙහි, ධනවන්තෙභි
කරණ	ධනවතා,	ධනවන්තෙහි,

WWW.PIRIVENA.LK

	ධනවන්තෙන	ධනවන්තෙහි
චතුත්ථී	ධනවතො, ධනවන්තස්ස	ධනවතං, ධනවන්තානං
පඤ්චමී	ධනවතා, ධනවන්තම්හා, ධනවන්තස්මා	ධනවන්තෙහි, ධනවන්තෙහි
ඡට්ඨී	ධනවතො, ධනවන්තස්ස	ධනවතං, ධනවන්තානං
සත්තමී	ධනවති, ධනවන්තෙ, ධනවන්තම්හි, ධනවන්තස්මිං	ධනවන්තෙසු

05. පිළිතුරු සපයන්න.

i. පුම්ත්ථීලිංග ශබ්ද 05ක් නම් කරන්න.

කට, සට, යට්ඨි, මුට්ඨි, සින්ධු, රේණු

ii. ප්‍රශ්නවාචී සර්ව නාම තුනක් නම් කරන්න.

කෙහි, කස්මිං, කෙන, කො

iii. ඉත්ථීලිංග නාම 5ක් නම් කරන්න.

කඤ්ඤා, රත්ති, නදී, ජම්බු, මාතු, ධීතු, අජා, එළකා, ගොතමී

iv. 'සබ්බයොනීන මා එ' සූත්‍රයේ අර්ථය ලියා උදාහරණ දෙන්න.

'යො' ප්‍රත්‍යය සඳහා 'ආ' ආදේශ වීම.

බුද්ධ + යො

බුද්ධ + ආ

බුද්ධා

v. ගුණවන්තු ශබ්දය මෙන් වරනැගෙන ශබ්ද 5ක් නම් කරන්න.

මඝවා - ශක්‍රයා

ඵලවා - ඵල ඇත්තා

WWW.PIRIVENA.LK

බලවා - බල ඇතතා

යතිමා - තපස් ඇත්තා

රාහුමා - රාහු

බුදධිමා - බුද්ධි ඇත්තා

WWW.PIRIVENA.LK

තෙවැනි පාඩම

රත්‍තකඛදමනො - රක්තාක්ෂ දමනය

අභ්‍යාසය

01. 'රත්‍තකඛදමනො' යන ඡේදය සිංහලට නගන්න.

❖ සො යක්ඛො මතමතො නිරාසඞ්කො ඛාදති.

ඒ යක්ෂයා මැරුණු මැරුණු අය සැක නැතිව කයි.

❖ තං යක්ඛං අදිස්වාපි යෙ යෙ නරා තෙන රොගෙනාතුරා තෙ පස්සන්ති, තෙපි සො රොගො ආවිසති.

ඒ යක්ෂයා නොදැකත් යම් යම් මිනිස්සු ඒ රෝගයෙන් පීඩා ඇත්තෝ වෙති ද උන්උන් බලන්නවුන්ටත් ඒ රෝගය වැළඳෙයි.

❖ එවං නචිරෙනෙව යක්ඛභයෙන රොගෙන ච ජනපදො විරලජනො ජාතො.

මෙසේ කෙටි කලකින්ම යක්ෂ භයෙන් ද රෝගයෙන් ද ජනපදය ජනරහිත වූයේ විය.

❖ රාජා තං පවත්තිං සුත්වා මයි රජ්ජං කාරෙන්තෙ පජානං ඊදිසස්ස භයස්ස උප්පජ්ජනං අනනුච්ඡවිකන්ති මඤ්ඤමානො තදහෙව අට්ඨංගසීලං සමාදියිත්වා අත්තනා නිච්චං කරියමානානි දසකුසලකම්මානි අනුස්සරිත්වා අහං ධම්මවිජයී භවිස්සාමීති තං රක්ඛස්ස අදිස්වා න උට්ඨහිස්සාමීති දළ්හතරං අධිට්ඨාය වාසගබ්භෙ සයි.

රජතුමා ඒ පුවත අසා මා රාජ්‍ය කරන කල්හි ප්‍රජාවට මෙබඳු භයක් ඉපැදීම සුදුසු නොවේයි සිතන්නේ ඒ දිනේම අෂ්ටාංග ශීලය සමාදන්වී තමා නිතර කරනු ලැබූ දසකුසලකර්ම සිහිකොට මම ධර්මයෙන් ජයගන්නා සුලුවෙමි ඒ යක්ෂයා නොදැක නොනැගිටිමි'යි ඉතා දැඩිව අධිෂ්ඨාන කොට වාසගෘහයෙහි සයනය කළේ ය.

❖ තස්ස තෙන ආචාරධම්මතෙජෙන රාජානුභාවෙන ච සො රක්ඛසො සන්තත්තො උත්‍රසිත්වා ඛණමපි ඨාතුං

WWW.PIRIVENA.LK

අසහන්තො ආකාසෙනාගන්ත්වා බලවපච්චුසසමයෙ අන්තොගබ්භං පවිසිතුමසක්කොන්තො බාහිරෙ ඨත්වා රඤ්ඤො අත්තානං දස්සෙසි.

ඒ රජතුමාගේ ආචාරධර්ම තේජසින් ද රාජ්‍යානුභාවයෙන් ද ඒ රකුසා තැවුණේ තැතිගෙන ක්ෂණයක් සිටින්නට නොහැකිවන්නේ අහසින් අවුත් ඉතා අලුයම කාලයෙහි ඇතුළු ගැබට පිවිසීමට නොහැකිව පිටතින් සිට රජුට තමාව දැක්වීය.

❖ රඤ්ඤා ච කොසි ත්වන්ති පුට්ඨො ආහ.

රජු විසින් ද තෝ කවරෙක් වෙහි දැයි විමසන ලද්දේ විය.

❖ රත්තක්ඛො නාමාහං රක්ඛසො දූරජනපදෙ ඨිතො අස්මි, අහං ඛණම්හි ඨාතුං අසක්කොන්තො තවානුභාවෙන බද්ධො විය හුත්වා ඉධානීතො, භයාමි දෙව තව දස්සනෙති.

මම රත්තාක්ෂ නම් වෙමි. දුර ජනපදයක සිටියේ වෙමි. මම ක්ෂණයක්වත් සිටීමට නොහැකි වන්නේ නුඹගේ ආනුභාවයෙන් බඳිනා ලද්දෙකු මෙන් වී මෙහි පමුණුවන ලද්දේ වූයෙමි. දේවයන් වහන්ස නුඹගේ දැක්මට (දර්ශනයට) බිය වෙමි'යි කීවේ ය.

02 පහත ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො දළ්හතරං අධිට්ඨාය වාසගබ්භෙ සයි ?

සිරිසඞ්ඝබොධි රාජා දළ්හතරං අධිට්ඨාය වාසගබ්භෙ සයි.

ii. කො අන්තොගබ්භං පවිසිතුමසක්කොන්තො බාහිරෙ අට්ඨාසි ?

යක්ඛො අන්තොගබ්භං පවිසිතුමසක්කොන්තො බාහිරෙ අට්ඨාසි.

iii. යක්ඛා කානි අඛාදි ?

යක්ඛා මත මතෙ මනුස්සෙ අඛාදි.

WWW.PIRIVENA.LK

iv. කො දූරජනපදෙ ඨිතො ?

රත්තක්ඛ යක්ඛො දූරජනපදෙ ඨිතො.

v. යක්ඛො කස්මිං සමයෙ රාජගෙහං පාවිසි ?

යක්ඛො බලවපච්චූස සමයෙ රාජගෙහං පාවිසි.

03. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ජනපදය ජනශූන්‍ය වූයේ කුමක් නිසා ද?

යක්ෂ හා රෝග බියෙන්

ii. දශකුශල කර්මපථ මොනවාද ?

1. අභිජ්ජා
2. මිච්ඡාදිට්ඨි
3. ව්‍යාපාද
4. පාණාතිපාතා
5. අදින්නාදානා
6. කාමමිච්ඡාචාර
7. මුසාවාද
8. පිසුණාවාච
9. පරුසාවාචා
10. සම්පප්ඵලාප

iii. රජු යක්ෂ බිය දුරුකිරීම සඳහා කුමක් කළේ ද?

අෂ්ටාංග ශීලය සමාදන් වී තමා මේ තරම් කාලයක් පුරා සිදු කළ දසකුසල කර්ම සිහි කිරීම හා යක්ෂයා නොදැක නොනැගිටිමියි අධිෂ්ඨාන කොට සයනයේ සැතපීම

iv. රකුසා බියට පත් වූයේ කුමක් නිසා ද?

රජතුමාගේ ආචාරධර්ම තේජසින් හා රජුගේ ආනුභාවයෙන්

WWW.PIRIVENA.LK

v. තුන් බිය නම් කරන්න.

රෝග බිය, දුර්භික්ෂ බිය, අමනුෂ්‍ය බිය

අභ්‍යාසය

1. සිංහලට නගන්න.

i. අයං රාජා නහායිතුං එතං නදිං ගච්ඡති.

මේ රජතුමා නෑමට ඒ නදියට යයි.

ii. සො භික්ඛූ පුරෙභත්තං ඉමං නගරං ආගමිස්සන්ති.

ඒ භික්ෂූන් වහන්සේලා පෙරවරුවෙහි මේ නගරයට එන්නෝ ය.

iii. සො කුමාරො තස්ස සත්ථුනො ධම්මං සුත්වා තං ගෙහං ගච්ඡති.

ඒ කුමාරයා ඒ ශාස්තෲන් වහන්සේගේ ධර්මය අසා ඒ නිවසට යයි.

iv. තස්ස සෙට්ඨිස්ස පුත්තො තෙසං ගහපතීනං ධනං දෙති.

ඒ සිටුවරයාගේ පුත්‍රයා ඒ ගෘහපතියන්ට ධනය දෙයි.

v. තෙ කුමාරා තාහි කුමාරීහි සද්ධිං වනං පවිසන්ති.

ඒ කුමාරවරු ඒ කුමරියන් සමග වනයට පිවිසෙති.

2. පාලියට නගන්න

i. රතු ගොණා නිල් තණ වේගයෙන් කයි.

රත්තගොණො (රත්තො ගොණො) නීලතිණං (නීලං තිණං) වෙගෙන (ජවෙන) ඛාදති.

ii. සිල්වත් භික්ෂුව සෑ මළුව හොඳින් අමදියි.

සීලවන්තො භික්ඛු චෙතියංගනං සාධුකං සම්මජ්ජති.

iii. කළු වඳුරා ඉදුණු ගෙඩි සෙමින් කඩයි.

කාලවානරො පක්කානි ඵලානි සනිකං ඔචිනාති (සෙමින් කඩයි යන අර්ථයෙන්/ නෙලයි)

WWW.PIRIVENA.LK

iv. ගුණවත් උපාසිකාව සිල්වත් භික්ෂුවට නිතර දන් දෙයි.
ගුණවතී උපාසිකා සීලවන්තං භික්ඛුනො නිච්චං දානං දදාති.

v. ශ්‍රද්ධාවන්තයෝ සුදු මලින් නිතර බුදුන් පුදති.
සද්ධාවන්තා සෙතපුප්ඵෙහි නිච්චං බුද්ධං පූජෙන්ති.

3. සුදුසු නාමපදය හිස් තැනට යොදන්න.

i. සක්කො තාවතිංසභවනෙ පටිවසති.
ii. අස්සා මග්ගෙ ධාවන්ති
iii. බුද්ධෙන දෙසිතො ධම්මො.
iv. සුණාථ ධාරෙථ චරාථ ධම්මෙ
v. තුම්හෙ චාරිකං චරථ.

4. පිළිතුරු සපයන්න.

i. නාම ප්‍රභේද නම් කර උදාහරණ එක බැගින් ලියන්න.

නාම ප්‍රභේදය	නිදසුන්
නාම නාම	රාජ, වනිතා, නර
සබ්බ නාම	කතර, කතම, අඤ්ඤතර
ගුණ නාම	සෙත, දීඝ, ආදී
ද්‍රව්‍ය නාම	පීඨ, මඤ්ච, බෙලමලල
ක්‍රියා නාම	ගච්ඡන්ත, නිසීදන්ත, පචන්ත
සඤ්ඤා නාම	සුද්ධොදන, කොසල, අජාතසත්තු

ii. 'ත' ශබ්දය යෙදුණු පාලි වාක්‍ය පහක් උපුටා දක්වන්න.

- තම්හා ආබාධා තථා පහීණොචායස්මතො......
- තෙසං සච්චෙන සීලෙන ......
- තෙන ඛො පන සමයෙන .....

WWW.PIRIVENA.LK

- නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
- තම්හි තම්හි සත්තනිකායා....

iii. 'ඉම' ශබ්දය යෙදුණු පාලි වාක්‍ය පහක් උපුටා තේරුම ද ලියන්න.

- ඉමිනා පුඤ්ඤකම්මෙන මා මෙ බාලසමාගමො........
- ඉමෙ එතෙ මහා බොධි ලොකනාථෙන පූජිතා..........
- ඉදං මෙ පුඤ්ඤකම්මං.........
- ඉමෙසු චතුසු අරියසච්චෙසු .....
- ඉමම්හි ගාමක්ඛෙත්තම්හි.....
- ඉමිනා තෙ සම්ජනධතු....

iv. ලිංගත්‍රයට අයත් නාම පද පහ බැගින් ලියන්න.

ලිංගය	නාම පද
පුල්ලිංග	නර, යක්ඛ, දෙව, මනුස්ස, සුරිය
ඉත්ථිලිංග	වනිතා, ලතා, නදී, ධෙනු, මාතු
නපුංසකලිංග	සුඛ, දුක්ඛ, චිත්ත, චක්ඛු, ඵල

5. පහත වාක්‍යාංශ පාලියට නගන්න.

i. ඒ භික්ෂූන්ගේ - තෙසං භික්ඛූනං
ii. ඒ ස්ත්‍රීන් සමග - තාහි ඉත්ථීහි
iii. කවර යක්ෂයන්ගේ - කෙසං යක්ඛානං
iv. මේ පින්කමෙන් - ඉමිනා පුඤ්ඤකම්මෙන
v. ඒ රජතුමාට - තස්ස රඤ්ඤො
vi. මේ මල් සමූහය - එතං කුසුමසන්තතිං
vii. එම රටවල්වල - ඉමෙසු රට්ඨෙසු

WWW.PIRIVENA.LK

viii. කවර භික්ෂූන්ට - කෙසං භික්ඛූනං

ix. මේ සත්‍ය වචනයෙන් - එතෙන සච්චවජ්ජේන

x. කවර භික්ෂුණීන්ගේ - කාසං භික්ඛුණීනං

WWW.PIRIVENA.LK

සිව්වන පාඩම

වාරණරාජා - ඇත් රජා

අභ්‍යාසය

1. 'වාරණරාජා' ඡේදය සිංහලට නගන්න.

❖ එකස්මිං කිර සමයෙ ලඞ්කායං දුට්ඨගාමිණී අභයො නාම රාජා රජ්ජං කාරෙසි.

එක් සමයක වනාහි ලංකාවෙහි දුටුගැමුණු අභය නම් රජතුමා රාජ්‍ය කළේ ය.

❖ තදා තස්ස තිස්සො නාමෙකො චූලූපට්ඨාකො අබ්භන්තරිකො හුත්වා රාජකම්මං කරොති.

එකල්හි ඔහුට තිස්ස නමැති එක් සුළු සේවකයෙක් ඉතා කුළුපග වී රජගෙදර වැඩ කරයි.

❖ තදා රඤ්ඤො කණ්ඩුලො නාම වාරණො නිගලඤ්ච ආලානඤ්ච භින්දිත්වා පාචීනපස්සං ගන්ත්වා වනං පවිසිත්වා කිසලපත්තාදයො ඡින්දිත්වා භින්දිත්වා ඛාදන්තො අනුක්කමෙන මහානිජ්ඣරවිහාරං ගන්ත්වා තෙසු තෙසු ඨානෙසු රුක්ඛමූලිකසුඤ්ඤාගාරිකාදයො යුත්තයොගෙ ඣානංගධරෙ භික්ඛූ දිස්වා පසන්නමානසො තෙසං ඵලාඵලාදයො ආහරිත්වා උපට්ඨානං කරොන්තො විහාසි.

එකල්හි රජතුමාගේ කණ්ඩුල නම් ඇත් රජු ඇතුන් බඳින දම්වැළ ද ඇතුන් බඳින කණුව ද බිඳ නැගෙනහිර දිශාවට ගොස් කැලයට පිවිස දළුකොළ ආදිය සිඳ බිඳ කන්නේ අනුක්‍රමයෙන් මහානිජ්ඣර විහාරයට ගොස් තැන් තැන්වල රුක්මුල් හිස් ගෙවල ආදියෙහි භාවනාවෙන් යුතු ධ්‍යානාංග ධාරී භික්ෂූන් වහන්සේ දැක පැහැදුණු මනසින් උන්වහන්සේලාට ගෙඩාගෙඩි (ඵලවැල) ගෙන අවුත් උපස්ථාන කරමින් වාසය කළේ ය.

❖ රාජා කිර තං හත්ථිනං ගතට්ඨානං උපපරික්ඛාපෙන්තො අදිස්වා චත්තාරො අමච්චෙ චතුද්දිසං පෙසෙන්තො චූලූපට්ඨාකතිස්සාමච්චං පාචීනපස්සං පෙසෙසි.

රජතුමා වනාහි ඒ ඇතා ගිය තැන සොයා බලන්නේ නොදැක ඇමතිවරුන් සිව් දෙනෙකු සිව් දිශාවලට යවන්නේ සුළු සේවක තිස්ස ඇමතියා නැගෙනහිර දිශාවට යැවී ය.

WWW.PIRIVENA.LK

❖ සෙසදිසාසු ගතා හත්‍ථිං න පස්සිංසු.

සෙසු දිශාවලට ගියෝ ඇතා නොදැක්කා හ.

❖ සො පනෙස අමච්චො ගාමනිගමපරම්පරාය විචරන්තො තමෙව විහාරං සම්පාපුණි.

ඒ ඇමතියා වනාහි ගම්නියම්ගම් පිළිවෙළින් විමසමින් එම විහාරයටම පැමිණියේ ය.

❖ තතො කණ්ඩුලො නාම වාරණරාජා තදා සුපක්කං කාරඵලසහිතං කාරසාඛං භින්දිත්‍වා භික්ඛූනං පතිගණ්හාපෙසි.

ඉක්බිති කණ්ඩුල නම් ඇත් රජා එකල්හි මනාව ඉදුණු කරගෙඩි සහිත අතු බිඳ භික්ෂූන්ට පිළිගැන්වී ය.

❖ අමච්චො රඤ්ඤො සන්තිකං ගන්ත්‍වා දෙව, නිජ්ඣරවිහාරෙ භික්ඛුනො වෙය්‍යාවච්චං කරොන්තො හත්‍ථිනාගෙ මයා දිට්ඨොති කථෙසි.

ඇමතියා රජ සමීපයට ගොස් 'දේවයන් වහන්ස' නිජ්ඣර විහාරයෙහි භික්ෂූන්ට වතාවත් කරමින් අත් රජු සිටිනු මා විසින් දකින ලද්දේ ය'යි කීවේ ය.

❖ තං සුත්‍වා රාජා ත්‍වමෙව භණෙ හත්‍ථිං ගහෙත්‍වා ආගච්ඡාහීති නියොජෙසි.

එය අසා රජතුමා 'බොළ තෝම ඇතා ගෙන එව'යි නියෝග කළේ ය.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො නාම රාජා තදා ලංකායං රජ්ජං කාරෙසි ?

දුට්ඨගාමිණී අභයො නාම රාජා තදා ලංකායං රජ්ජං කාරෙසි.

ii. වාරණො තෙසු තෙසු ඨානෙසු කිං අපස්සි ?

වාරණො තෙසු තෙසු ඨානෙසු යුත්තයොගෙ ඣානාංගධරෙ භික්ඛු අපස්සි.

iii. රාජා ගජං උපපරික්ඛිතුං කති අමච්ච පෙසෙසි ?

රාජා ගජං උපපරික්ඛිතුං චත්තාරො අමච්ච පෙසෙසි.

iv. වාරණරාජා භික්ඛූනං කානි පතිගණ්හාපෙසි ?

වාරණරාජා භික්ඛූනං සුපක්කං කාරඵලානි පතිගණ්හාපෙසි.

WWW.PIRIVENA.LK

v. වාරණරාජා කෙසං උපට්ඨානං අකාසි ?

වාරණරාජා ඣානංගධරෙ භික්ඛූනං උපට්ඨානං අකාසි.

3. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. දුටුගැමුණු රජුගේ විශ්වාසදායී සුළු සේවකයාගේ නම කුමක් ද?

තිස්ස ඇමතියා

ii. දුටුගැමුණු රජුගේ ඇතාගේ නම කුමක් ද?

කණ්ඩුල

iii. භාවනාවට යෝග්‍ය ස්ථාන මොනවා ද?

රුක්මුල්, මිනිසුන් රහිත ස්ථාන, ලියගොමු

iv. බුදුරජාණන් වහන්සේට තිරිසන් සතුන් විසින් උපස්ථාන කළ අවස්ථාවන් සඳහන් කරන්න.

පාරිලෙය්‍ය ඇත් රජු, පාරිලෙය්‍ය වනයේ වඳුරා

v. සතර දිසාවන් නම් කරන්න.

උතුර දකුණ නැගෙනහිර බස්නාහිර

අභ්‍යාසය

1. පහත සඳහන් ඒකවචන ක්‍රියාපසද බහුවචනයට හරවන්න.

i. කාරෙසි - කාරෙසුං

ii. පවිස්සති - පවිස්සන්ති

iii. භින්දිං - භින්දිම්හා, භින්දිම්හ

iv. පස්සි - පස්සිංසු

v. ආහරිස්සති - ආහරිස්සන්ති

vi. පෙසෙසි - පෙසෙසුං

vii. සම්පාපුණි - සම්පාපුණිංසු

viii. සුණො - සුණාථ

ix. භින්දිස්සං - භින්දිස්සාමෙහ

WWW.PIRIVENA.LK

x. පතිගණ්හාපෙසි - පතිගණ්හාපෙසුං

2. පහත වාක්‍ය අතීත හා අනාගත කාලයට හරවා ලියන්න. අර්ථය ද ලියන්න.

i. සොමපාලො නාමෙකො උපාසකො අබ්භන්තරිකො හුත්වා ථෙරස්ස වෙය්‍යාවච්චං කරොති.

සෝමපාල නම් එක් උපාසකයෙක් විශ්වාසවන්ත වී තෙරුන්ට වත්පිළිවෙත් කරයි.

- සොමපාලො නාමෙකො උපාසකො අබ්භන්තරිකො හුත්වා ථෙරස්ස වෙය්‍යාවච්චං කරි.

  සෝමපාල නම් එක් උපාසකයෙක් විශ්වාසවන්ත වී තෙරුන්ට වත්පිළිවෙත් කළේ ය.

- සොමපාලො නාමෙකො උපාසකො අබ්භන්තරිකො හුත්වා ථෙරස්ස වෙය්‍යාවච්චං කරිස්සති.

  සෝමපාල නම් එක් උපාසකයෙක් විශ්වාසවන්ත වී තෙරුන්ට වත්පිළිවෙත් කරන්නේ ය.

ii. පරිවෙණෙ සාමණෙරා තෙසු තෙසු ඨානෙසු නිසීදිත්වා පොත්ථකානි පඨන්ති.

පිරිවෙණේ සාමණේරයන් වහන්සේලා තැන්තැන්වල හිඳ පොත් පාඩම් කරති.

- පරිවෙණෙ සාමණෙරා තෙසු තෙසු ඨානෙසු නිසීදිත්වා පොත්ථකානි පඨිංසු.

  පිරිවෙණේ සාමණේරයන් වහන්සේලා තැන්තැන්වල හිඳ පොත් පාඩම් කළහ.

- පරිවෙණෙ සාමණෙරා තෙසු තෙසු ඨානෙසු නිසීදිත්වා පොත්ථකානි පඨිස්සන්ති.

  පිරිවෙණේ සාමණේරයන් වහන්සේලා තැන්තැන්වල හිඳ පොත් පාඩම් කරන්නෝ ය.

WWW.PIRIVENA.LK

iii. සංචාරකජනා ගාමනිගමරාජානීසු විචරිත්වා කොළම්බනගරමෙව පාපුණන්ති.

සංචාරක ජනයෝ ගම්නියම්ගම් පිළිවෙළින් විමසා කොළඹ නගරයට ම පැමිණෙති.

- සංචාරකජනා ගාමනිගමරාජානීසු විචරිත්වා කොළම්බනගරමෙව පාපුණිංසු.

  සංචාරක ජනයෝ ගම්නියම්ගම් පිළිවෙළින් විමසා කොළඹ නගරයට ම පැමිණියහ.

- සංචාරකජනා ගාමනිගමරාජානීසු විචරිත්වා කොළම්බනගරමෙව පාපුණිස්සන්ති.

  සංචාරක ජනයෝ ගම්නියම්ගම් පිළිවෙළින් විමසා කොළඹ නගරයට ම පැමිණෙන්නෝ ය.

iv. මයං පසන්නමානසා ඵලාඵලාදයො ආහරිත්වා භික්ඛූනං පූජෙම.

අපි පැහැදුණු සිතින් ඵලාඵල ගෙනැවිත් භික්ෂූන්ට පූජා කරමු.

- මයං පසන්නමානසා ඵලාඵලාදයො ආහරිත්වා භික්ඛූනං පූජයිම්හා.

  අපි පැහැදුණු සිතින් ඵලාඵල ගෙනැවිත් භික්ෂූන්ට පූජා කළෙමු.

- මයං පසන්නමානසා ඵලාඵලාදයො ආහරිත්වා භික්ඛූනං පූජෙස්සාම.

  අපි පැහැදුණු සිතින් ඵලාඵල ගෙනැවිත් භික්ෂූන්ට පූජා කරන්නෙමු.

v. තුම්හෙ චතුද්දිසං ගන්ත්වා චොරෙ උපපරික්ඛථ.

නුඹලා සිව්දිශාවට ගොස් සොරුන් සොයව්.

- තුම්හෙ චතුද්දිසං ගන්ත්වා චොරෙ උපපරික්ඛිත්ථ.

  නුඹලා සිව්දිශාවට ගොස් සොරුන් සෙව්වෙහු.

WWW.PIRIVENA.LK

- තුම්හෙ චතුද්දිසං ගන්ත්වා චොරෙ උපපරික්ඛිස්සථ.
  නුඹලා සිව්දිශාවට ගොස් සොරුන් සොයන්නෙහු.

3. හිස්තැනට සුදුසු ක්‍රියාපදය යොදා මෙම වාක්‍යය සිංහලට නගන්න.

(පටිසෙවාමි, වන්දෙ, ආමන්තෙසි, අභිනන්දුං, අනුස්සරෙථ)

i. තත්‍ර ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ <u>ආමන්තෙසි.</u>
ii. අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං <u>අභිනන්දුං</u>.
iii. <u>අනුස්සරෙථ</u> සම්බුද්ධං භයං තුම්හාකනොසියා
iv. පටිසඞ්ඛායොනිසො සෙනාසනං <u>පටිසෙවාමි.</u>
v. අහං <u>වන්දෙ</u> තං බොධිපාදපං.

- සිංහලට නැගීම

i. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පස්වග භික්ෂූන් ආමන්ත්‍රණය කළ සේක.
ii. සතුටු සිතැති පස්වග භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙසුමට සතුටු වූහ.
iii. නුඹලාට බයක් ඇති වූ විට සම්බුදුරදුන් සිහිකරවු.
iv. නුවණින් බලා මනා සිහියෙන් යුතුව සෙනසුන් දරමි.
v. මම ඒ බෝමැඩ වඳිමි.

4. පාලියට නගන්න.

i. මම හැමදා පිරිවෙණට යමි.
   අහං සබ්බදා පරිවෙණං ගච්ඡාමි.
ii. අපි සියලු දෙනා ම දිනපතා බුදුන් වඳිමු.
   මයං සබ්බෙව දෙවසිකං බුද්ධං වන්දාම.

WWW.PIRIVENA.LK

iii. ඔබ ගෙදර යන්න කැමති ද?

ත්වං ගෙහං ගන්තුං ඉච්ඡසි ?

iv. නුඹලා මව්පියන්ට සලකහු.

තුම්හෙ මාතාපිතුන්නං උපට්ඨහථ.

v. ඔබ පාලි භාෂාව ඉගෙනීමට කැමති වන්නෙහි ද?

ත්වං පාලිභාසං උග්ගණ්හිතුං ඉච්ඡසි ?

5. සිංහලට නගන්න.

i. රාජානො අත්තානං කුමාරෙ නා නා සිප්පානි සික්ඛාපෙසුං.

රජවරු තමන්ගේ කුමාරවරුන් නොයෙක් ශිල්ප ඉගැන්වූහ.

ii. මනුස්සා අයුක්ඛයෙන ච පුඤ්ඤක්ඛයෙන මරන්ති.

මිනිස්සු ආයුෂ කෙළවර වීමෙන් ද පින් කෙළවර වීමෙන් ද මැරෙති.

iii. 'තයො මෙ භික්ඛවෙ ගිලානා සංවිජ්ජමානා ලොකස්මිං'

මහණෙනි මට ලෝකයෙහි ගියනුන් තිදෙනෙක් පෙනෙයි.

iv. අනාථපිණ්ඩිකො නිබද්ධං දිවසස්ස ද්වෙ වාරෙ තථාගතස්සුපට්ඨානං ගච්ඡති.

අනාථපිණ්ඩික නිතර දිනකට දෙවරක් තථාගතයන් වහන්සේට උපස්ථානය සඳහා (බුද්ධ උපස්ථානයට) යයි.

v. බොධිසත්තො භාතිකසතස්ස කනිට්ඨො අහොසි.

බෝධිසත්ත්වයන් වහන්සේ සහෝදරයන් සියයකට බාලයා වූහ. (විය)

WWW.PIRIVENA.LK

පස්වැනි පාඩම

පුඤ්ඤකරණස්ස සහායො - පින් කිරීමට සහායකයෙක්

අභ්‍යාසය

1. 'පුඤ්ඤකරණස්ස සහායො' ඡේදය සිංහලට නගන්න.

❖ අථ අපරභාගෙ එකො අස්සවාණිජකො පුබ්බන්තාපරන්තං ගච්ඡන්තො ආගමම ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි.

ඉක්බිති පසුකලෙක එක් අශ්වවෙළෙන්දෙක් පෙරඅපරදිග යන්නේ පැමිණ ඇගේ ගෙයි නවාතැන් ගත්තේ ය.

❖ අථ සො වාණිජො තං දිස්වා ධීතුසිනෙහං පතිට්ඨාපෙත්වා ගන්ධමාලවත්ථාලංකාරාදීහි තස්සා උපකාරකො හුත්වා ගමනකාලෙ අම්ම, එතෙසු අස්සෙසු තව රුච්චනකං අස්සං ගණ්හාහීති ආහ.

ඉක්බිති ඒ වෙළෙන්දා ඒ දැක දුවට සෙනෙහස පිහිටුවා සුවඳමාලවස්ත්‍රාලංකාරාදියෙන් ඇයට උපකාර වී යන කල්හි දරුව, මේ අශ්වයන් අතුරින් නුඹ කැමති අශ්වයෙකු ගන්න යැයි කීවේ ය.

❖ සා'පි අස්සෙ විලොකෙත්වා එකං සින්ධවපොතකං දිස්වා එතං මෙ දෙහී'ති ආහ.

❖ ඇයත් අශ්වයන් පරීක්ෂා කරන්නේ එක් සෛන්ධව පැටියෙකු දැක මූ මට දෙන්නැයි කීවා ය.

❖ වාණිජො, අම්ම, එසො සින්ධවපොතකො අප්පමත්තා හුත්වා පටිජග්ගාහී'ති වත්වා තං පටිපාදෙත්වා අගමාසි.

වෙළෙන්දා දරුව, ඒ සෛන්ධව පැටියෙකි. අප්‍රමාදී වී පෝෂණය කරන්නැයි කියා ඌ සකස් කර දී ගියේ ය.

❖ සා'පි තං පටිජග්ගමානා ආකාසගාමීභාවං ඤත්වා සම්මා පටිජග්ගන්තී එවං චින්තෙසි.

ඇයත් ඌ පෝෂණය කරන්නී අහසින් යන බව දැන මනාකොට පෝෂණය කරන්නී මෙසේ සිතුවා ය,

❖ ''පුඤ්ඤකරණස්ස මෙ සහායො ලද්ධො'ති.

පින් කිරීම සඳහා මට සහායකයෙක් ලැබුණේ ය' යනුවෙනි.

WWW.PIRIVENA.LK

- අගතපුබ්බා ච මෙ භගවතො සමාරං මාරබලං විධමෙත්වා බුද්ධභූතස්ස ජයමහාබොධිභූමි.

  මගේ බුදුරජාණන් වහන්සේ මරුන් සහිත මාර බලය පරාජය කොට බුදුබවට පත් ජයමහා බෝධියට නොගිය විරූ ය. (යෑමට නොහැකිවිය)

- යනනූනාහං තත්ථ ගන්ත්වා භගවතො ජයමහාබොධිං වන්දෙය්‍යන්ති චින්තෙත්වා බහුරජතසුවණ්ණමාලාදයො කාරාපෙත්වා එකදිවසං අස්සමභිරූයහ ආකාසෙන ගන්ත්වා බොධිමාලකෙ ඨත්වා ආගච්ඡන්තු අය්‍යා සුවණ්ණමාලා පූජෙතුන්ති උග්ගොසෙසි.

  මම එහි ගොස් භාග්‍යවතුන් වහන්සේගේ ජයමහාබෝධිය වඳින්නේ නම් ඉතා මැනවැයි සිතා බොහෝ රන්රිදීස්වර්ණමාලාදිය කරවා එක් දිනක් අශ්වයා මත නැගී අහසින් ගොස් බෝමළුවෙහි සිට 'ස්වර්ණමාලා පූජාකිරීමට ආර්යයන් වහන්සේලා පැමිණෙත්වා'යි ඝෝෂණය කළා ය.

2. පාලි භාෂාවෙන් පිළිතුරු සපයන්න.

   i. කො ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි ?

      අස්සවාණිජො ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි.

   ii. අස්සවාණිජො තස්සා කිං අදාසි ?

      අස්සවාණිජො තස්සා ගන්ධමාලවත්ථාලංකාරාදීහි අදාසි.

   iii. සා සින්ධවපොතකස්ස කීදිසං විසෙසං අඤ්ඤාසි ?

      සා සින්ධවපොතකස්ස ආකාසගාමීභාවං අඤ්ඤාසි

   iv. සා කථං බොධිමාලකං අගමාසි ?

      සා අස්සමාරූයහ ආකාසෙන බොධිමාලකං අගමාසි.

3. ඡේදය ඇසුරින් සිංහලෙන් පිළිතුරු සපයන්න.

   i. නිවැසි කාන්තාවට වෙළෙන්දාගෙන් ලැබුණු දේ මොනවාද ?

      සුවඳ මල් වස්ත්‍රාභරණ ආදිය

   ii. 'ජයමහාබෝධිභූමි' ලෙස එම ස්ථානය හැඳින්වීමට හේතුව ලියන්න.

WWW.PIRIVENA.LK

බෝධිසත්ත්වයන් වහන්සේ දසමරුන් පරාජය කොට සම්බෝධියට පත් වූ නිසා

iii. ආර්යයන් වහන්සේලාට බෝධිමලුවට වඩින්නැයි අයැද සිටියේ කුමක් සඳහා ද?

රත්තරන් මාලාදාම පූජා කිරීම සඳහා

iv. 'අරියසාවක' යන්නට අයත් ආර්ය පුද්ගලයෝ කවරහු ද?

සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන මාර්ග හා ඵලවලට පැමිණි පිරිස

අභ්‍යාස

1. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. අනුරාධපුරෙ මහාචෙතියානි සන්ති.

අනුරාධපුරයෙහි මහාචෛත්‍ය ඇත. (ස්ථූපයෝ ඇත්තාහ)

ii. බුද්ධො ලංකාභූමිං තික්ඛත්තුං පාපුණි.

බුදුරජාණන් වහන්සේ ලක්දිවය තෙවරක් පැමිණි සේක.

iii. තුම්හෙ පතිදිනං මාතාපිතුනනං උපට්ඨහථ.

නුඹලා දිනපතා දෙමාපියන්ට උපස්ථාන කරව්.

iv. සො විහාරං ගන්ත්වා බුද්ධං වන්දිත්වා පුන ගෙහං ගච්ඡති.

ඔහු විහාරයට ගොස් බුදුන් වැඳ නැවත නිවසට යයි.

v. පුඤ්ඤවන්තො කුමාරො පුඤ්ඤං කරිස්සති.

පින්වන්ත කුමාරයා පින් කරන්නේ ය.

2. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. සියලු පව් නොකරන්න. කුසල් වඩන්න. සිත දමනය කරගන්න යන මෙය බුදුරදුන්ගේ අනුශාසනාවයි.

සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා

සචිත්තපරියොදපනං - එතං බුද්ධානසාසනං

ii. පමාවීම මරණයට හේතුවයි. නොපමාව නිවණට හේතු වෙයි.

WWW.PIRIVENA.LK

අප්පමාදො අමතපදං - පමාදො මච්චුනොපදං

iii. බුදුරජාණන් වහන්සේ මුල මැද අග යහපත් වූ ධර්මය දෙසූ සේක.

iv. භගවා ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං ධම්මං දෙසෙසි.

v. සෝක නොකරන්න. නොවැලපෙන්න. ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුණ් වෙමු.

මා සොචිත්ථ, මා පරිදෙවිත්ථ, සුමුත්තා මයං තෙන මහා සමණෙන.

vi. සියලු සත්ත්වයෝ සතුටු සිතැත්තෝ වෙත්වා.

සබ්බෙ සත්තා සුමනා භවන්තු.

3. පහත වචන යොදා වාක්‍ය සකස් කරන්න.

- ගවෙසයාථ - උපාසකො ගාමං ගවෙසයාථ.
- පපචිත්ථ - මාතා ඔදනං පපචිත්ථ.
- පපච - අහං භත්තං පපච.
- ලිඛම්හා - මයං ලෙඛනානි ලිඛම්හා.
- ධාවිස්සං - අහං පාඨාලයං සීඝං ධාවිස්සං.
- දදිස්සති - ධනපාලො නිබද්ධං දානං දදිස්සති.
- භවෙය්‍යාම - මයං අවෙරා භවෙය්‍යාම.
- අකාසි - දුට්ඨගාමිණී රාජා අනුරාධපුරෙ රජ්ජං අකාසි.
- සුණාතු - දෙවො ධම්මං සුණාතු.
- අදදිං - අහං යාචකාය දානං අදදිං.

4. භූ, ලිඛ, සු, ධා, කර ධාතු අජ්ජතනී, පරොක්ඛා, භවිස්සන්ති යන ආඛ්‍යාතවල පරස්සපදයෙහි වරනගන්න.

භූ අජ්ජතනී ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**

WWW.PIRIVENA.LK

පඨම පුරිස	භවි	භවිංසු
මජ්ඣිම පුරිස	භවො	භවිත්ථ
උත්තම පුරිස	භවිං	භවිම්හා

භූ පරොක්ඛා ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	භව	භවු
මජ්ඣිම පුරිස	භවෙ	භවිත්ථ
උත්තම පුරිස	භව	භවිම්හා

භූ භවිස්සන්ති ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	භවිස්සති	භවිස්සන්ති
මජ්ඣිම පුරිස	භවිස්සසි	භවිස්සථ
උත්තම පුරිස	භවිස්සාමි	භවිස්සාම

ලිඛ අජ්ජතනී ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	ලිඛි	ලිඛිංසු
මජ්ඣිම පුරිස	ලිඛො	ලිඛිත්ථ
උත්තම පුරිස	ලිඛිං	ලිඛිම්හා

ලිඛ පරොක්ඛා ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	ලිඛ	ලිඛු
මජ්ඣිම පුරිස	ලිඛෙ	ලිඛිත්ථ
උත්තම පුරිස	ලිඛ	ලිඛිම්හා

ලිඛ භවිස්සන්ති ආඛ්‍යාත පරස්ස පදෙ

WWW.PIRIVENA.LK

පුරිස	එකවචන	බහුවචන
පඨම පුරිස	ලිඛිස්සති	ලිඛිස්සන්ති
මජ්ඣිම පුරිස	ලිඛිස්සසි	ලිඛිස්සථ
උත්තම පුරිස	ලිඛිස්සාමි	ලිඛිස්සාම

සු අජ්ජතනී ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	සුණි	සුණිංසු
මජ්ඣිම පුරිස	සුණො	සුණිත්ථ
උත්තම පුරිස	සුණිං	සුණිම්හා

සු පරොක්ඛා ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	සුසොව	සුසොවු
මජ්ඣිම පුරිස	සුසාවෙ	සුසාවිත්ථ
උත්තම පුරිස	සුසාව	සුසාවිම්හා

සු භවිස්සන්ති ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	සුණිස්සති	සුණිස්සන්ති
මජ්ඣිම පුරිස	සුණිස්සසි	සුණිස්සථ
උත්තම පුරිස	සුණිස්සාමි	සුණිස්සාම

ධා අජ්ජතනී ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	ධාවි	ධාවිංසු
මජ්ඣිම පුරිස	ධාවො	ධාවිත්ථ
උත්තම පුරිස	ධාවිං	ධාවිම්හා

WWW.PIRIVENA.LK

ධා පරොක්ඛා ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	ධාව	ධාවු
මජ්ඣිම පුරිස	ධාවෙ	ධාවිත්ථ
උත්තම පුරිස	ධාව	ධාවිම්හා

ධා භවිස්සන්ති ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	ධාවිස්සති	ධාවිස්සන්ති
මජ්ඣිම පුරිස	ධාවිස්සසි	ධාවිස්සථ
උත්තම පුරිස	ධාවිස්සාමි	ධාවිස්සාම

කර අජ්ජතනී ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	කරි	කරිංසු
මජ්ඣිම පුරිස	කරො	කරිත්ථ
උත්තම පුරිස	කරිං	කරිම්හා

කර පරොක්ඛා ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	කර	කරු
මජ්ඣිම පුරිස	කරෙ	කරිත්ථ
උත්තම පුරිස	කර	කරිම්හා

කර භවිස්සන්ති ආඛ්‍යාත පරස්ස පදෙ		
පුරිස	**එකවචන**	**බහුවචන**
පඨම පුරිස	කරිස්සති	කරිස්සන්ති
මජ්ඣිම පුරිස	කරිස්සසි	කරිස්සථ

WWW.PIRIVENA.LK

උත්තම පුරිස	කරිස්සාමි	කරිස්සාම

WWW.PIRIVENA.LK

සයවැනි පාඩම

පිතුසිනෙහං - පිතෘ ස්නේහය

අභ්‍යාසය

1. 'පිතු සිනෙහං' ඡේදය පාලියට නගන්න.

❖ අතීතෙ උත්තරාපථෙ කංසභොගෙ අසිතඤ්ජනනගරෙ මහාකංසො නාම රාජා රජ්ජං කාරෙසි.

අතීතයෙහි උතුරු ප්‍රදේශයෙහි කංසභෝගයෙහි අසිතඤ්ජන නගරයෙහි මහාකංස නම් රජතුමා රාජ්‍යය කළේ ය.

❖ තස්ස කංසො ච උපකංසො චාති ද්වෙපුත්තා අහෙසුං.

ඔහුට කංස, උපකංස යැයි පුත්තු දෙදෙනෙක් වූහ.

❖ දෙවගබ්භා නාම එකා ධීතා.

දේවගබ්බ නම් දියණියක් වූවා ය.

❖ තස්සා ජාතදිවසෙ නෙමිත්තකබ්‍රාහමණා 'එතිස්සා කුච්ජියං නිබ්බත්තපුත්තො කංසගොත්තං කංසවංසං නාසෙස්සතී'ති බ්‍යාකරිංසු.

ඈ උපන් දිනයේ නිමිති බමුණෝ ' මැයගේ කුසෙහි උපන්නා වූ පුත්‍රයා කංස ගෝත්‍රය කංස වංශය නසන්නේය යි ප්‍රකාශ කළහ.

❖ රාජා බලවසිනෙහෙන ධීතරං නාසෙතුං නාසක්ඛි, 'භාතරො ජානිස්සන්තී'ති යාවතායුකං ඨත්වා කාලමකාසි.

රජතුමා බලවත් සෙනෙහසින් දියණිය නැසීමට නොහැකි විය. 'සහෝදරයෝ දැනගන්නාහු' යැයි ආයුෂ ඇතිතෙක් සිට කළුරිය කළේ ය.

❖ තස්මිං කාලකතෙ කංසො රාජා අහොසි. උපකංසො උපරාජා.

ඔහු කළුරිය කිරීමෙන් පසු කංස රජ විය. උපකංස උපරජ විය.

❖ තෙ චින්තයිංසු.

ඔවුහු සිතූහ.

WWW.PIRIVENA.LK

❖ 'සචෙ මයං භගිනි නාසෙස්සාම, ගාරය්හා භවිස්සාම, එතං කස්සචි අදත්වා නිස්සාමිකං කත්වා පටිජග්ගිස්සාමා'ති.

ඉදින් අපි නැගෙණිය නසන්නෙමු නම් ගැරහිය යුතු වූවෝ වන්නෙමු. මැය කිසිවෙකුටත් නොදී ස්වාමියා නැත්තියක කොට පෝෂණය කරන්නෙමු' යනුවෙනි.

❖ තෙ එකථූණකං පාසාදං කාරෙත්වා තං තත්ථ වසාපෙසුං.

ඔවුහු එක් ටැම් ගෙයක් කරවා ඇය එහි වාසය කරවූහ.

❖ නන්දගොපා නාම තස්සා පරිචාරිකා අහොසි.

නාන්දගෝපා නම් ඇයගේ සහායිකාව වූවා ය.

❖ අන්ධකවෙණ්හු නාම දාසො තස්සා සාමිකො ආරක්ඛමකාසි.

අන්ධක වේණු නම් දාසයා ඇගේ අයිතිකාරයා ආරක්ෂාව ලබා දුන්නේ ය.

❖ තදා උත්තරමධුරාය මහාසාගරො නාම රාජා රජ්ජං කාරෙසි.

එකල උතුරු මධුරාවෙහි මහාසාගර නම් රජතුමා රාජ්‍ය කළේ ය.

❖ තස්ස සාගරො උපසාගරො චාති ද්වෙපුත්තා අහෙසුං.

ඔහුට සාගර උපසාගර යැයි දරුවෝ දෙදෙනෙක් වූහ.

❖ තෙසු පිතු අච්චයෙන සාගරො රාජා අහොසි. උපසාගරො උපරාජා.

එයින් පිය ඇවෑමෙන් සාගර රජ විය. උපසාගර උපරජ විය.

❖ සො උපකංසස්ස සහායකො එකාචරියකුලෙ එකතො උග්ගහිතසිප්පො.

ඔහු උපකංසගේ සහායක එක් ආචරිය කුලයක එකට හැදෑරූ ශිල්ප ඇත්තෙකි.

❖ සො භාතු අන්තෙපුරෙ දුබ්භහිත්වා ගය්හමානො පලායිත්වා කංසභොගෙ උපකංසස්ස සන්තිකං අගමාසි.

ඔහු සහෝදර අන්තඃපුරයෙහි ද්‍රෝහියෙක් වී අල්ලාගනු ලබන්නේ පලා ගොස් කංසභෝගයෙහි උපකංසගේ සමීපයට ගියේ ය.

WWW.PIRIVENA.LK

- උපකංසො තං කංස රඤ්ඤො දස්සෙසි, රාජා තස්ස මහන්තං යසං අදාසි.

  උපකංස ඒ කංස රජුට දැක්වී ය. රජතුමා ඔහුට මහත් සම්පත් දුන්නේ ය.

- සො රාජුපට්ඨානං ගච්ඡන්තො දෙවගබ්භාය නිවාසං එකත්ථූණිකපාසාදං දිස්වා 'කස්සෙසකො නිවාසො'ති පුච්ඡිත්වා තං කාරණං සුත්වා දෙවගබ්භාය පටිබද්ධචිත්තො අහොසි.

  ඔහු රාජ්‍ය උපස්ථානයට යන්නේ දේවගබ්භාවගේ නිවස එක්ටැම්ගෙය දැක 'කවරෙක් වාසය කරයිදැ'යි විමසා ඒ කරුණ අසා දේවගබ්භාව පිළිබඳ සිත් බැඳුණේ විය.

2. ඡේදය ඇසුරින් පාලියෙන් පිළිතුරු සපයන්න.

   i. මහාකංසො රාජා කස්මිං නගරෙ රජ්ජං කාරෙසි ?

      මහාකංසො රාජා අසිතඤ්ජන නගරෙ රජ්ජං කාරෙසි

   ii. මහාකංසරඤ්ඤො කා නාම ධීතා අහොසි ?

      මහාකංසරඤ්ඤො දෙවගබ්භා නාම ධීතා අහොසි.

   iii. මහාකංසරඤ්ඤො කෙ නාම පුත්තා අහෙසුං ?

      මහාකංසරඤ්ඤො කංසො ච උපකංසො චා'ති දෙවපුත්තා අහෙසුං.

   iv. උත්තරමධුරායං කො රජ්ජං කාරෙසි ?

      උත්තරමධුරායං මහාසාගරො රජ්ජං කාරෙසි.

   v. දෙවගබ්භාය කා නාම පරිචාරිකා අහොසි ?

      දෙවගබ්භාය නන්දගොපා නාම පරිචාරිකා අහොසි.

3. සිංහලෙන් පිළිතුරු සපයන්න.

   i. මහාකංස රජුගේ දියණිය උපන්දා නිමිති පාඨකයෝ රජුට කුමක් කීවාහු ද?

      මැයගේ කුසින් උපදින දරුවා කංස ගෝත්‍රයත් කංස වංශයත් විනාශ කරන්නේ ය.

WWW.PIRIVENA.LK

ii. සහෝදරවරු නැගණිය නොමරා පෝෂණය කළේ කුමක් නිසා ද?

ඔවුන් ගර්හාවට ලක් වන නිසා

iii. උපසාගර යුවරජු උත්තරමධුරාවෙන් පැන ආවේ කුමක් නිසා ද?

අන්තඃපුරයෙහි ද්‍රෝහියෙකු වූ නිසා

iv. උපසාගර හා උපකංස අතර වූයේ කවර හිතවත් බවක් ද?

එක් ගුරුවරයෙකු ළඟ එකට ශිල්ප ඉගෙනීම

3. ඡේදයේ වාක්‍ය රටාව අනුගමනය කොට පාලියට නඟන්න.

i. පෙර ලක්දිව මාගම් නුවර කාවන්තිස්ස නම් රජෙක් රාජ්‍ය කරවීය.

පුබ්බෙ ලංකාදීපෙ මාහාගාම නගරෙ කාකවණ්ණතිස්ස නාම රාජා රජ්ජං කාරෙසි.

ii. ඔහුට අභය හා තිස්ස යැයි කුමාරවරු දෙදෙනෙක් වූහ.

තස්ස අභයො ච තිස්සො චාති ද්වෙපුත්තා අහෙසුං.

iii. එක් දියණියක් ද වූවා ය.

iv. එකා ධීතා.

v. අභය කුමාරයා පියරජුගේ වචනයට ද්‍රෝහි වී දීඝවාපියට පලා ගියේ ය.

අභයො නාම කුමාරො පිතුවචනස්ස දුබ්භිත්වා දීඝවාපිං පලායි.

vi. දියණිය ගිහිගෙන් නික්ම පැවිදි වූවා ය.

ධීතා අගාරස්මා අනගාරියං පබ්බජි.

vii. පියරජුගේ ඇවෑමෙන් අභය කුමාරයා රජ වීය.

පිතු අච්චයෙන අභය කුමාරො රාජා අහොසි.

viii. තිස්ස කුමරු යුවරජ විය.

තිස්සො උපරාජා.

අභ්‍යාස

WWW.PIRIVENA.LK

01. සුදුසු පද වරහන් තුලින් තෝරා හිස්තැන් පුරවා සිංහලට නගන්න.

(නිවාසිතත්තා, නාම, රඤ්ඤො, පට්ඨාය, අකංසු, උත්තරමජ්ඣිමපදෙසෙ, නක්ඛත්තෙන, සිරිලංකායං, චිරකාලං, මහාමහින්දත්ථෙරො, අජ්ජා'පි, වන්දිතුං, බුද්ධසාසනං, විදෙසීය, පස්සිතුං)

අනුරාධපුරං

අනුරාපුරං පන උත්තරමජ්ඣිමපදෙසෙ පතිට්ඨිතං හොති. අනුරාධනාම අමච්චෙන නිවාසිතත්තා වා අනුරාධ නක්ඛත්තෙන පතිට්ඨාපිතත්තා ච අනුරාධපුරං නාම හොති. පණ්ඩුකාභය රඤ්ඤො කාලෙ ඉදං පුරං සිරිලංකායං අග්ගරාජධානි අහොසි. තතො පට්ඨාය බහවො සීහලරාජානො චිරකාලං අග්ගරාජධානිං කත්වා රට්ඨපරිපාලනං අකංසු. දෙවානම්පියතිස්සරඤ්ඤො කාලෙ මහාමහින්දත්ථෙරො ලඞ්කාදීපෙ බුද්ධසාසනං පතිට්ඨාපෙසි. තතොප්පභුති අස්මිං නගරෙ චෙතියාරාමපසාදමන්දිරා කාරාපිතා හොන්ති. සිරිමහාබොධිං ච සොවණ්ණමාලිමහාචෙතිං ච අජ්ජාපි අනුරාධපුරෙ දිස්සති. එතරහි දෙසීය විදෙසීය සංචාරකා පූජනීයට්ඨානානි වන්දිතුං නට්ඨාවසිට්ඨානි පස්සිතුං අනුරාධපුරං ගච්ඡන්ති.

අනුරාධපුරය

අනුරාධපුරය වනාහි උතුරු මැද ප්‍රදේශයෙහි පිහිටියේ වෙයි. අනුරාධ නම් ඇමතියා වාසය කළ බැවින් හෝ අනුරාධ නැකතික් පිහිට වූ බැවින් අනුරාධපුර නම් වෙයි. පණ්ඩුකාභය රාජ්‍ය කාලයෙහි මෙම නගරය ශ්‍රී ලංකාවෙහි අගනුවර විය. එතැනි පටන් බොහෝ සිංහලරජවරු බොහෝ කලක් අගනුවර කොට රට පාලනය කළහ. දේවානම්පියතිස්ස රාජ්‍ය කාලයෙහි මහා මහින්ද තෙරණුවෝ ලංකාදීපයෙහි බුද්ධශාසනය පිහිටවූයේ ය. එතැන් පටන් මේ නගරයෙහි චෛත්‍ය ආරාම මාළිගා කරවූයේ වෙති. ශ්‍රී මහාබෝධිය ද රුවන්වැලි මහසෑය ද අදද අනුරාධපුරයෙහි පෙනේ. දැන් දේශීය විදේශීය සංචාරකයෝ පූජනීය ස්ථාන වැඳීමට නටබුන් තැන් බැලීමට අනුරාධපුරයට යති.

WWW.PIRIVENA.LK

02. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. සිද්ධත්ථකුමාරො ආසාළ්හපුණ්ණමායං රත්තියං සරාභිනික්ඛමි.

සිද්ධාර්ථ කුමාරයා ඇසළ පුන්පෝදා රාත්‍රියෙහි ගිහිගෙයින් නික්මුණේ ය.

ii. සංඝමිත්තාථෙරී දක්ඛිණබොධිසාඛං ගහෙත්වා මාගසිරෙ පණ්ණරසියං ලංකාදීපමුපාගමි.

සංඝමිත්තා තෙරණිය දක්ෂිණ බෝධි ශාඛාව ගෙන උඳුවප් පෝ දින ලංකාවට පැමිණියා ය.

iii. භගවා එකස්මිං ඵුස්සමාසෙ චන්දවාරෙ ලංකාදීපමාගන්ත්වා යක්ඛෙ දමෙසි.

භාග්‍යවතුන් වහන්සේ එක් දුරුතු මසක සඳුදා දිනයෙහි ලංකාදීපයට වැඩම කොට යක්ෂයන් දමනය කළ සේක.

iv. භගවතො පරිනිබ්බානතො චත්තාලීසාධිකචතුසතෙ වස්සෙ ථෙරා මාතුලපදෙසෙ ආලොකගුහායං තෙපිටකං පොත්ථකෙසු ලිඛිංසු.

භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවීමෙන් හාරසිය හතළිස් වර්ෂයේ තෙරහු මාතලේ ආලෝකලෙණෙහි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළහ.

v. මයං චන්දවාරතොප්පභුති යාව සුක්කවාරො පරිවෙණං ගන්ත්වා තත්ථ සිප්පං ගණ්හාම.

අපි සඳුදා පටන් සිකුරාදා දක්වා පරිවෙණට ගොස් එහි ශිල්ප ගනිමු.

03. පහත සංඛ්‍යා පාලියෙන් ලියන්න.

i. 276 - ඡසත්තාධිකද්විසතං

ii. 2568 - අට්ඨසට්ඨාධිකපඤ්චසතුත්තරද්විසහස්සං

iii. 3264 - චතුසට්ඨාධිකද්විසතුත්තරතිසහස්සං

iv. 5635 - පඤ්චතිංසාධිකඡසතුත්තරපඤ්චසහස්සං

v. 84000 - චතුරාසීතිසහස්සං

WWW.PIRIVENA.LK

04. පහත මාතෘකා සඳහා වාක්‍ය 06කට නොඅඩු රචනා පාලියෙන් ලියන්න.

i. මම පරිවෙණං

මම පරිවෙණං නාම සිරි විජ්ජානන්ද පරිවෙණං. තං බිබිල නගරෙ යලකුඹුර ගාමෙ දස්සනීය භූමිභාගෙ පතිට්ඨාපිතං හොති. මම පරිවෙණෙ බහූ සිස්සා උග්ගණ්හන්ති. ඒත්ථවන්තෙ අත්ථදස්සි යතිස්සරො කිච්චාධිකාරො භවති. තථා පදියතලාවෙ ඤාණවිමලත්ථෙරො පරිවෙණාධිපති භවති. තං පරිවෙණං අතිසය ජනප්පිය පරිවෙණන්ති බහවො ජනා චින්තෙසුං.

ii. සිරිලංකාදීපං

මම ජාතදෙසං පන සිරිලංකාදීපං හොති. තං ඉන්දීය සාගරෙ මජ්ඣිමට්ඨානෙ පතිට්ඨිතං හොති. විජයො නාම කුමාරො තත්ථ පඨමං ජනපදං කාරෙසි. පච්ඡා පණ්ඩුකාභය, දෙවානම්පියතිස්ස, දුට්ඨගාමිණි ආදි රාජානො රජ්ජං කාරෙසුං. ලොකෙ දස්සනීයෙසු රට්ඨෙසු ලංකාදීපං පඨමට්ඨානෙ භවති.

iii. පුලත්ථිපුරං

අම්හාකං රට්ඨෙ දුතිය රාජධානිං පුලත්ථිපුරං හොති. තත්ථ පඨමං විජයබාහු නාම රාජා රජ්ජං කාරෙසි. චොළස්ස පරක්කමං විද්ධංසනං කත්වා සො ලංකාදීපං එකච්ඡත්තං කාරෙසි. පුලත්ථිපුරෙ බහූ චෙතියානි සන්ති. තථා ච අතිදස්සනීයා භවන්ති. පාසාණවිහාරං ච ආලාහණ පරිවෙණං ච තත්ථ පතිට්ඨාපිතා හොන්ති. මහාපරක්කමබාහු රාජා, නිස්සංකමල්ල රාජා තත්ථෙව රාජානො භවිංසු.

iv. සාරිපුත්තත්ථෙරො

උපතිස්සො නාම පරිබ්බාජකො පච්ඡා සාරිපුත්තත්ථෙරො'ති පඤ්ඤායි. තස්ස මාතා සාරී බ්‍රාහ්මණී. තථා ච කොලිතො නාම පරිබ්බාජකො ගහට්ඨකාලෙ සහායකො භවි. ද්වෙ පරිබ්බාජකා බුද්ධස්ස සමීපෙ පබ්බජිතා අග්ගසාවකා භවිංසු.

v. ගජො

ගජො වනෙ වසති. සො චතුප්පදො හොති. වනෙ විසාලතමො ගජො භවති. ගජො සොණ්ඩාය පහරිත්වා සාඛං භින්දිත්වා ඛාදති. බහුජනා ගජෙ පස්සිතුං වනං ගච්ඡන්ති.

WWW.PIRIVENA.LK

හත්වැනි පාඩම

දෙවෙන මයහං පුත්තස්ස ජාතකාලෙ වරො දින්නො

ස්වාමියා විසින් මගේ පුතා ඉපදුණු දිනයේ වරයක් දෙනු ලැබුවේ ය.

අභ්‍යාසය

1. 'දෙවෙන මයහං පුත්තස්ස ජාතකාලෙ වරො දින්නො' යන ඡේදය සිංහලට නගන්න.

❖ අතීතෙ කාසිරට්ඨෙ බාරාණසියං බ්‍රහ්මදත්තො රාජා අහොසි. තදා බොධිසත්තො තස්ස අග්ගමහෙසියා කුච්ඡිස්මිං පටිසන්ධිං ගණ්හි. තස්ස නාමගහනගහණ දිවසෙ මහිංසාසකුමාරොති නාමං අකංසු. තස්ස ආධාවිත්වා පරිධාවිත්වා විචරණකාලෙ රඤ්ඤො අඤ්ඤොපි පුත්තො ජාතො.

අතීතයෙහි කාසිරට බරණැස්නුවර බ්‍රහ්මදත්ත රජ විය. එකල්හි බෝධිසත්ත්වයන් වහන්සේ ඔහුගේ අගමෙහෙසියගේ කුසෙහි පිළිසිඳ ගත්තේ ය. ඔහුට නම් තබන දිනයෙහි මහිංසාස කුමාර යැයි නම් කළහ. ඔහුගේ දුවපැන ඇවිදින කල්හි රජතුමාට වෙනත් කුමරෙක් ඉපදිණි.

❖ තස්ස චන්දකුමාරොති නාමං අකංසු.

ඔහුට සූර්ය කුමාර යැයි නම් කළහ.

❖ තස්ස පන අධාවිත්වා පරිධාවිත්වා විචරණ කාලෙ බොධිසත්තමාතා කාලමකාසි.

ඔහුගේ දුව පැන ඇවිදිනකල බෝධිසත්ත්වයන්ගේ මව කළුරිය කළා ය.

❖ රාජා අඤ්ඤං අග්ගමහෙසිට්ඨානෙ ඨපෙසි.

රජතුමා වෙනකෙක් අගමෙහෙසි තැන තැබුවේ ය.

❖ සා රඤ්ඤො පියා අහොසි, මනාපා.

ඇය රජතුමාට ප්‍රිය විය. මනාප විය.

4. පහත සඳහන් වාක්‍ය පාලියට පරිවර්තනය කරන්න.

i. පිණ්ඩෝල භාරද්වාජ හිමියෝ අහසින් ගොස් පාත්‍රය ගත්හ.

පිණ්ඩොල භාරද්වාජ භික්ඛු ආකාසෙන ගන්ත්වා පත්තං ගණ්හි.

ii. දේවානම්පියතිස්ස රජතුමා මහාමහින්ද තෙරුන්ගේ ධර්මය අසා බුද්ධ ශ්‍රාවකයෙක් විය.

දෙවානම්පියතිස්ස රාජා මහාමහින්දත්ථෙරස්ස ධම්මං සුත්වා බුද්ධසාවකො භවි.

iii. බුදුන් වහන්සේ සත් දිනක අනුපිය අඹ වනයෙහි විසූ සේක.

බුද්ධො සත්තාහං අනුපිය අම්බවනෙ වසි.

iv. වෙළෙන්දා ආයුධයක් ගෙන දොරටුපාලයාට පහර දුන්නේ ය.

වාණිජො ආයුධං ගහෙත්වා ද්වාරපාලකං පහරි.

v. බරණැස් මහරජ බෑණාට ස්වකීය දූ කුමරිය දී රාජ්‍යයෙහි අභිෂේක කරවී ය.

බාරාණසී මහාරාජා භාගිණෙය්‍යං අත්තනො ධීතරං දත්වා රජ්ජෙ අභිසෙකං කාරෙසි.

WWW.PIRIVENA.LK

5. පිළිතුරු ලියන්න.

i. සමාස වර්ග කීය ද? ඒ මොනවා ද?

සමාස වර්ග 6කි. කම්මධාරය, දිගු, තප්පුරිස, බහුබ්බීහි, ද්වන්ද, අව්‍යයීභාව ලෙසිනි.

ii. සමාසවල ප්‍රයෝජන කවරේ ද?

ලේඛනයේ පහසුව, භාෂණයේ පහසුව, කෙටි බව, ව්‍යක්ත බව, මටසිලිටි බව, ගාථා බන්ධනයේ දී පහසුව

iii. මහාබොධිපතිට්ඨාපනං ඡේදයේ එන සමාස පද 10ක් උපුටා වර්ග කරන්න.

- මහාරාජා
- උත්තරද්වාරතො
- ජම්බුකොළපට්ටනා
- මහාසමුද්දෙ
- සමුද්දසාලාවත්ථුස්මිං
- මහාබොධිං
- තුට්ඨමානසො
- පඤ්චවණ්ණෙහි
- පුප්ඵධූපගන්ධාදීහි
- බොධිරුක්ඛාති
- දසබලස්ස
- සමුද්දතීරෙ
- අනුපුබ්බෙන
- මහාසක්කාරං
- දක්ඛිණද්වාරෙන
- උදුම්බරබොධි
- නිග්‍රොධබොධි
- මහාමෙඝ
- රාජවත්ථු

iv. පහත සඳහන් පද වාක්‍යවල යොදන්න.

පච්ඡාභත්තං, යාවජීවං, ජිනවචනං, ගුත්තිලාචරියො, චොරභයං

i. බුද්ධො <u>පච්ඡාභත්තං</u> ධම්මසාලායං ධම්මං දෙසෙසි.

WWW.PIRIVENA.LK

ii. සො <u>යාවජීවං</u> උපාසකො භවි.

iii. මයං <u>ජිනවචනං</u> සාධුකං සුණාම.

iv. <u>ගුත්තිලාචරියො</u> බාරාණසියං ජීවති.

v. තම්හි වනපදෙසෙ <u>චොරභයං</u> අත්ථි.

WWW.PIRIVENA.LK

දහතුන් වැනි පාඩම

නිග්‍රොධසාමණෙරො - නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ

අභ්‍යාසය

❖ එවං ගච්ඡන්තෙ කාලෙ එකදිවසං සීහපඤ්ජරෙ ඨිතො අද්දස, නිග්‍රොධසාමණෙරං රාජඞ්ගණෙ ගච්ඡන්තං දන්තං ගුත්තං සන්තින්ද්‍රියං ඉරියාපථසම්පන්නං, කො පනායං නිග්‍රොධ නාම, බින්දුසාරරඤ්ඤො ජෙට්ඨපුත්තස්ස සුමනරාජකුමාරස්ස පුත්තො.

මෙසේ ගතවන කල්හි එක දවසක් සීමැදුරෙහි සිටියේ රජ මිදුලෙහි යන්නා වූ දැමුණු රැකුණු සන්සුන් ඉඳුරන් ඇති ඉරියව්වලින් යුතු නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ දුටුවේ ය. නිග්‍රෝධ නම් මොනු කවරෙක් ද? බින්දුසාර රජුගේ වැඩිමහල් පුතා සුමන රජකුමරුගේ පුතා ය.

❖ 'තත්‍රායං ආනුපුබ්බී කථා. බින්දුසාරරඤ්ඤො කිර දුබ්බලකාලෙයෙව අසොකකුමාරො අත්තනා ලද්ධං උජ්ජෙනිරජ්ජං පහාය ආගන්ත්වා සබ්බං නගරං අත්තනො හත්ථගතං කත්වා සුමනරාජකුමාරං අග්ගහෙසි.

මේ එහි පිළිවෙළ කථාවයි. බින්දුසාර රජුගේ දුර්වල කාලයේම වනාහි අශෝක කුමාරයා තමා ලද උදේනි රාජ්‍යය අතහැර පැමිණ සියලු නගරය තමාගේ අණසකට පත්කොට සුමන රාජකුමාරයා අල්ලා ගත්තේ ය.

❖ තං දිවසමෙව සුමනස්ස රාජකුමාරස්ස සුමනා නාම දෙවී පරිපුණ්ණගබ්භා අහොසි.

ඒ දවසේම සුමන රාජකුමාරයාගේ සුමනා නම් දේවිය පිරිපුන් ගැබ ඇත්තී විය.

❖ සා අඤ්ඤාතකවෙසෙන නික්ඛමිත්වා අවිදූරෙ අඤ්ඤතරං චණ්ඩාලගාමං සන්ධාය ගච්ඡති.

ඇය අන්‍ය වේශයකින් නික්මී නුදුරෙහි එක්තරා චණ්ඩාල ගමක් සඳහා යයි.

WWW.PIRIVENA.LK

❖ ජෙට්ඨකචණ්ඩාලස්ස ගෙහතො අවිදූරෙ එකස්මිං නිග්‍රොධරුක්ඛෙ අධිවත්ථාය දෙවතාය 'ඉතො එහි සුමනෙ'ති වදන්තියා සද්දං සුත්වා තස්සා සමීපං ගතා.

වැඩිහිටි චණ්ඩාලයාගේ ගෙයට නොදුරෙහි එක් නුග ගසක අධිගෘහිත දේවතාවෙකු සුමනාවෙනි, මෙහි එන්න' යැයි කියන ශබ්දය අසා ඇය සමීපයට ගියා ය.

❖ දෙවතා අත්තනො ආනුභාවෙන එකං සාලං නිම්මිණිත්වා එත්ථ වසාහීති පාදාසි.

දේවතාවිය තමාගේ ආනුභාවයෙන් එක් ශාලාවක් මවා එහි වසන්නැයි දුන්නී ය.

❖ සා තං සාලං පාවිසි.

ඇය ඒ ශාලාවට පිවිසියා ය.

❖ ගතදිවසෙයෙව පුත්තං විජායි.

පැමිණි දින ම පුත්‍රයකු වැදුවා ය.

❖ සා තස්ස නිග්‍රොධ දෙවතාය පරිග්ගහිතත්තා නිග්‍රොධොත්වෙව නාමං අකාසි.

ඇය ඔහුට නුගදෙවියා රැකගත් බැවින් නිග්‍රෝධ යන නම ම තැබුවා ය.

❖ ජෙට්ඨකචණ්ඩාලො දිට්ඨදිවසතොප්පභූති තං අත්තනො සාමිධීතරං විය මඤ්ඤමානො නිබද්ධං වට්ටං පට්ඨපෙසි.

වැඩිහිටි චණ්ඩාලයා දුටු දිනයේ පටන් ඔහු තමාගේ ස්වාමි දියණිය මෙන් හඟිමින් නිතර වැටුප් පිහිටු වී ය.

❖ රාජධීතා තත්ථ සත්තවස්සානි වසි.

රාජ දියණිය එහි වර්ෂ හතක් වාසය කළා ය.

❖ නිග්‍රොධකුමාරො'පි සත්තවස්සිකො ජාතො.

නිග්‍රෝධ කුමාරයාත් ඉපදී සත් වසක් ඉක්ම ගියේ ය. (විය)

❖ තදා මහාවරුණත්ථෙරො නාම එකො අරහා දාරකස්ස හෙතුසම්පදං දිස්වා විහරමානො සත්තවස්සිකො'දානි

WWW.PIRIVENA.LK

දාරකො, කාලො, නං පබ්බාජේතුන්ති චින්තෙත්වා රාජධීතාය ආරොචාපෙත්වා නිග්‍රොධකුමාරං පබ්බාජෙසි.

එකල්හි මහාවරුණ නම් එක් රහතන් වහන්සේ නමක් දරුවාගේ හේතුසම්පත් දැක වසන්නේ දැන් දරුවාට සත්වසකි. පැවිදි කරන්නට කාලයයි සිතා රජ දියණියට දන්වවා නිග්‍රෝධ කුමාරයා පැවිදි කර වී ය.

❖ කුමාරො ඛුරග්ගයෙව අරහත්තං පාපුණි.

කුමාරයා දැලිපිහියෙන් හිසමුඬුකොට අවසන් වෙද්දී ම රහත් බවට පැමිණියේ ය. (පත් විය)

2. ඡේදය ඇසුරින් පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො පන දන්තො ගුත්තො සන්තින්ද්‍රියො ඉරියාපථසම්පන්නො අහොසි ?

නිග්‍රොධ සාමණෙරො පන දන්තො ගුත්තො සන්තින්ද්‍රියො ඉරියාපථසම්පන්නො අහොසි.

ii. සුමනස්ස රාජකුමාරස්ස කා නාම දෙවී අහොසි ?

සුමනස්ස රාජකුමාරස්ස සුමනා නාම දෙවී අහොසි.

iii. කො සුමනාය දෙවියා සාලං නිම්මිණිත්වා අදාසි ?

නිග්‍රොධරුක්ඛෙ අධිවත්ථාය දෙවතාය සුමනාය දෙවියා සාලං නිම්මිණිත්වා අදාසි.

iv. නිග්‍රොධ සාමණෙරස්ස කො නාම ආචරියො අහොසි ?

නිග්‍රොධ සාමණෙරස්ස වරුණත්ථෙරො නාම ආචරියො අහොසි.

v. නිග්‍රොධකුමාරො කතිවස්සිකකාලෙ පබ්බජි ?

නිග්‍රොධකුමාරො සත්ත වස්සිකකාලෙ පබ්බජි.

3. සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. නිග්‍රෝධ කුමරුගේ මව හා පියා කවු ද?

සුමන තරුණයා හා සුමනා දේවිය

WWW.PIRIVENA.LK

ii. සුමනා දේවිය වෙස් වළාගෙන යාමට හේතු වූ කරුණ කුමක් ද?

අශෝක කුමාරයා නගරය අල්ලාගෙන සුමන කුමාරයා ද අල්ලාගත් නිසා

iii. සුමනා දේවිය සැඩොල්ගම කොපමණ කාලයක් විසුවා ද?

වර්ෂ 07ක්

iv. 'ඛුරග්ගයෙව අරහත්තං පාපුණි' යන්නට විවරණයක් සපයන්න.

දැලිපිහිටෙන් හිසකෙස් කැපීම. පැවිදි වන්නට හිස මුඩු කරන අවස්ථාවේ තච පංචකය කියනු ලැබේ. එහි දී අනිත්‍යතාව මෙනෙහි කිරීමෙන් ප්‍රඥාවන්ත අය රහත් වෙයි.

අභ්‍යාසය

1. පහත වාක්‍ය සිංහලට නගන්න.

i. අථ ඛො වච්ඡායනො මානවො යෙන භගවා තෙනුපසඞ්කමි.

ඉක්බිති වනාහි වච්ඡාන ගෝත්‍රික මානවකයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට පැමිණියේය.

ii. අභිධම්මිකො ආචරියො ආරඤ්ඤකානං භික්ඛූනං සන්දිට්ඨිකං ධම්මං කථෙසි.

ආභිධම්මික ගුරුවරයා අරණ්‍යවාසී භික්ෂූන්ට මෙලොව දීම විපාක දෙන ධර්මය දේශනා කළේ ය.

iii. දොවාරිකො භණ්ඩාගාරිකං ඝාතෙත්වා රඤ්ඤො ධනං චොරෙසි.

දොරටුපාලයා භාණ්ඩාගාරිකයා නසා (ඝාතනය කොට) රජුගේ ධනය සොරකම් කළේ ය.

iv. ලංකායං සුත්තන්තිකා ච වෙනයිකා ච ආභිධම්මිකා ච මාතුලගාමෙ ආලොකගුහං සන්නිපතිත්වා භගවතො ධම්මං පොත්ථකෙසු ලිඛිංසු.

WWW.PIRIVENA.LK

ලංකාවෙහි සූත්‍ර දන්නෝ ද විනය දන්නෝ ද අභිධර්මය දන්නෝ ද මාතලේ ආලෝක ගුහාවට රැස් වී භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය ග්‍රන්ථාරූඪ කළහ. (පොත්වල ලියූහ)

v. භාණ්ඩාගාරිකස්ස භාගිනෙය්‍යො රාජකොට්ඨාගාරා බහුං ධනං ගහෙත්වා අත්තනො අත්ථාය යොජෙසි.

භාණ්ඩාගාරිකයාගේ බෑණා රජුගේ ගබඩාවෙන් බොහෝ ධනය ගෙන තමාගේ ප්‍රයෝජනය පිණිස යෙදවී ය.

2. පාලියට නගන්න. (සුදුසු තන්හි තද්ධිත පද යොදන්න.)

i. භාරද්වාජගේ පුත්‍රයා කච්චායන තෙරුන්ගේ බෑණා විය.

භාරද්වාජො කච්චායන ථෙරස්ස භාගිණෙය්‍යො අහොසි.

ii. අතීතයෙහි මාර්ගවල බොහෝ කරත්තකරුවෝ ද පදිකයෝ ද වූහ.

අතීතෙ මග්ගෙසු බහුසාකටිකා ච පදිකා ච අහෙසුං.

iii. තෙරුන් වහන්සේලාගේ පේළියෙහි අන්තයෙහි සිටින සාමණේර හිමි අභිධර්මය උගත් කෙනෙක් වෙයි.

ථෙරානං අන්තරෙ තිට්ඨන්තො සාමණෙරො ආභිධම්මිකො භවති.

iv. ඡබ්බග්ගිය භික්ෂූහු ශාක්‍යපුත්‍රක භික්ෂූන්ට නුසුදුසු (අනුචඡවික) කටයුතු රාශියක් කළහ.

ඡබ්බග්ගියා භික්ඛූ සක්‍යානං භික්ඛූනං අනුච්ඡවිකානි කම්මානි කාරෙසුං.

v. නගරවැසියන්ගේ දරුවෝ රනින් කරන ලද හෝ රිදියෙන් කරන ලද මල්මාලා පළඳිති.

නාගරිකානං දාරකා සුවණ්ණමයං වා රජතමයං වා මාලායො පිළන්ධන්ති.

3. පහත අදහස එන තද්ධිත පදය සුදුසු ප්‍රත්‍යය උපයෝගී කරගෙන සකස් කරන්න.

i. විධවා (වැන්දඹුවගේ පුතු) - වෙධවෙර

ii. කුසිනාරා (කුසිනාරාවෙහි උපන්) - කොසිනාරක

WWW.PIRIVENA.LK

iii. දක්ඛිණා (දක්ෂිණාවට සුදුසු) - දකඛිණෙයය
iv. වන (වනයෙහි හටගත්) - වානෙයය
v. වීණා (වීණාශිල්ප දන්නා) - වෙණික
vi. සංඝ (සංඝයාට අයත්) - සංඝික
vii. පරදාර (පරඹුවන් සේවනය කරන්නා) - පරදාරික
viii. අන්ත (කෙළවර) - අනතරික
ix. ලොක (ලෝකයට අයත්) - ලොකික
x. සූකර (ඌරන් මරන්නා) - සූකරික

4. පහත 'අ' කොටසේ විග්‍රහයට අදාළ තද්ධිත පදය 'ආ' කොටසින් තෝරා ප්‍රකෘති ප්‍රත්‍යය වෙන් කර ලියන්න.

අ	පිළිතුර	ආ
වසුදෙවසස පුතෙතා	වසුදෙව + න වාසුදෙවො	ආදිචෙචා
රොහිණියා පුතෙතා	රොහිණි + ණෙයය රොහිණෙයය	ගාමතා
අදිතියා පුතෙතා	අදිති + ණය	ඵසසදසං
නාවාය තරතීති	නාවා + ණික නාවිකො	පඤඤවවගගියා
ධමෙම පසනෙනා	ධමම + ණික ධමමිකො	රොහිණෙයයො
නිරයෙ ජාතො	නිරය + ණික නෙරයිකො	නෙරයිකො
පචඡා ජාතො	පචඡා + ඉම පචඡිමො	පචඡිමො

WWW.PIRIVENA.LK

පඤ්චවග්ගො	පඤ්චවග්ග + ණික	නාවිකො
ඵනතො ජාතං	ඵන + ණ්‍ය ඵඤ්ඤං	වාසුදෙවො
ගාමානං සමූහො	ගාම + තා ගාමතා	ධම්මිකො

5. දී ඇති තද්ධිත පද යෝග්‍ය පරිදි යොදා ඡේදය පාලියට නගන්න.

- ගෞතම ගෝත්‍රයේ උපන ශාක්‍යපුත්‍ර වූ භාග්‍යවතුන් වහන්සේ එක්තරා කාලයක කුසිනාරාවට ගොස් කුසිනාරා වැසියන්ට තමා විසින් දතයුතු වූ ධර්මය දෙශනා කළ සේක.

  ගොතමො සක්‍යපුත්තිකො භගවා එකස්මිං සමයෙ කුසිනාරං ගන්ත්වා කොසිනාරකානං ධම්මං දෙසෙසි.

- කුසිනාරාවෙහි වසන තෙල් වෙළෙන්දෝ සහල් වෙළෙන්දෝ ගැල්පදවන්නෝ පයින් යන්නෝ දොරටුපාලවරු භාණ්ඩාගාරිකවරු ආදී බොහෝ මිනිස්සු ධර්මය ඇසූහ.

  කොසිනාරකා තෙලිකා තණ්ඩුලිකා සාකටිකා පදිකා දොවාරිකා භාණ්ඩාගාරිකාදි බහුමනුස්සා ධම්මං සුණිංසු.

- බණ අසා ධර්මයෙහි පැහැදුණාහු උදෑසන පිණ්ඩපාතික භික්ෂූන්ට දන් පිරිනැමූහ. සමහරු ධනය යොදවා ආරාම කොට සංඝයාට අයත් කොට පූජා කළහ.

  ධම්මං සුත්වා ධම්මිකා පාතො පිණ්ඩපාතිකානං භික්ඛූනං දානානි පටිග්ගහෙසුං. අප්පෙකච්චෙ ධනානි යොජෙත්වා ආරාමං පටියාදෙත්වා සංඝිකං කත්වා පූජෙසුං.

- සමහරු පැවිදි වූහ. පැවිදි වූ සූත්‍රාන්ත උගත්තෝ විනය උගත්තෝ අභිධර්මය උගත්තෝ වූහ. ඇතැම් භික්ෂූහු ආරඤ්ඤක වූ වෘක්ෂමූලික වූවෝ බවුන් වඩා රහත් බව ලැබූහ.

WWW.PIRIVENA.LK

අප්පෙකච්චෙ පබ්බජිංසු. පබ්බජිතා සුත්තන්තිකා වෙනයිකා ආභිධම්මිකා භවිංසු. එකච්චෙ භික්ඛූ ආරඤ්ඤකා රුක්ඛමූලිකා කම්මට්ඨානං වඩ්ඪෙත්වා අරහත්තං පාපුණිං.

අරහත්තං, පිණ්ඩපාතිකානං, දොවාරිකා, ආරඤ්ඤකා, සුත්තන්තිකා, ධම්මිකා, සක්‍යපුත්තිකො, ආභිධම්මිකා, සන්දිට්ඨිකං, තණ්ඩුලිකා, ගොතමො, සංඝිකං, පදිකා, රුක්ඛමූලිකා, වෙනයිකා, භාණ්ඩාගාරිකා, භගවා, තෙලක, කොසිනාරකා, සාකටිකා, කොසිනාරකානං

WWW.PIRIVENA.LK

දාහතර වන පාඩම

ගාමවාසිනො මම වචනං සුණාථ අජ්ජ රත්තිභාගෙ එකො අමනුස්සො ආගච්ඡති

ගම්වැසියනි මගේ වචනය අසව්, අද රාත්‍රියෙහි එක් අමනුෂ්‍යයෙක් එයි.

අභ්‍යාසය

❖ සීහලදීපෙ කිර මහාතලාක නාම විහාරං අහොසි.

හෙළදිවයිනෙහි වනාහි මහාතලාක නම් විහාරයක් විය.

❖ තත්ථ එකො අභයත්ථෙරො නාම පරියත්තිධරො තෙපිටකො ගාමන්තසෙනාසනං පහාය තස්සාසනෙනයෙව එකස්මිං වනසණ්ඩෙ කතපණ්ණසාලාය පටිවසති.

එහි එක් අභය තෙර නමින් පර්යාප්තිධර ත්‍රිපිටකධාරී තෙරනමක් කෙළවර සෙනසුන හැර ඒ අසල ම එක් කැලෑවක කරන ලද සෙනසුනක වාසය කරයි.

❖ සො අපරභාගෙ අරඤ්ඤකමහාභයත්ථෙරොති පාකටො අහොසි.

උන්වහන්සේ පසුකාලයේ අරඤ්ඤකමහා අභය තෙර යනුවෙන් ප්‍රකට විය. (වනවාසී මහා අභය තෙර)

❖ අථෙකස්මිං සමයෙ එකො උපාසකො තං උපසංකමිත්වා වන්දිත්වා ධම්මං සුත්වා පසන්නමානසො තං යාචිත්වා ද්වාදසසංවච්ඡරානි පච්චයෙහි චතූහි පටිජග්ගි.

ඉක්බිති එක් සමයක එක් උපාසකයෙක් උන්වහන්සේ සමීපයට පැමිණ වැඳ ධර්මය අසා පැහැදුණු මනසින් උන්වහන්සේ ඉල්ලා දොළොස් වසරක් සිව්පසයෙන් උපස්ථාන කළේ ය.

❖ සො ථෙරස්ස චීවරත්ථාය කාලෙන කාලං සාටකං දෙති.

ඔහු තෙරුන්ට සිවුරු පිණිස කලින් කලට සළුවක් දෙයි.

❖ දිනන්දිනානි තස්සෙව අන්තරගෙහෙ හරන්තිකො නාම එකො චොරො රත්තියං ගහෙත්වා හරති.

දෙන දෙන ලද්ද එහි ම ඇතුළුගෙයි හරන්තික නම් එක් සොරෙක් රාත්‍රියෙහි ගෙන යයි.

WWW.PIRIVENA.LK

❖ ථෙරො දුබ්බලචීවරොයෙව හොති.

තෙරුන් වහන්සේගේ දුර්වල සිවුර ඇත්තේ ම වෙයි.

❖ අථෙකස්මිං දිවසෙ උපාසකො විහාරං ගන්ත්වා ථෙරස්ස දුබ්බලානි චීවරානි දිස්වා චීවරත්ථාය සකටානි දත්වා එවං චින්තෙසි.

ඉක්බිති එක් දිනක උපාසකයා විහාරයට ගොස් තෙරුන්ගේ දුර්වල චීවරය දැක සිවුරු පිණිස සළු දී මෙසේ සිතුවේ ය.

❖ මයා පතිමස්ස බහූනි චීවරසාටකානි දින්නානි.

මා විසින් මොහුට බොහෝ සිවුරු රෙදි දෙන ලදි.

❖ නාපි චීවරං කත්වා පාරුපති.

සිවුරු කොට නොපොරවයි.

❖ න සන්නිධිට්ඨානං වා අඤ්ඤස්ස දානං වා පඤ්ඤායති.

තැන්පත් කිරීමක් හෝ අනුන්ට දීමක් නො නොපෙනේ.

❖ කාරණෙන ඉමස්ස භවිතබ්බන්ති ආසන්නට්ඨානෙ මග්ගා ඔක්කම්ම නිලීනො අට්ඨාසි.

මෙයට කරුණක්වියයුතුයි, සමීප ස්ථානයක පාරෙන් ඉවත් වී සැඟවී සිටියේ ය.

❖ ගච්ඡන්තාගච්ඡන්තෙ උපපරික්ඛමානො.

යන එන අය පරීක්ෂා කරමින් ය.

❖ තතො චොරො ථෙරස්ස සාකටානි උපනීතභාවං ඤත්වා තං ගණ්හිස්සාමීති රත්තිභාගෙ විහාරං ගන්ත්වා සාටකානි ගහෙත්වා පුන තෙනෙව මග්ගෙන ආගච්ඡති.

ඉක්බිති සොරා තෙරුන්ට සළු ගෙන එන ලද බව දැන එය ගන්නෙමියි රාත්‍රිකාලයේ විහාරයට ගොස් සළු ගෙන නැවත ඒ මගෙන්ම එයි.

❖ තතො උපාසකො සහභණ්ඩකං චොරං දිස්වා වෙගෙන ගන්ත්වා තස්ස චූලං ගහෙත්වා එත්තකං කාලං අයාසස්ස මයා දින්නානි සාකටානි ගණ්හනෙතා ත්වමරෙති පුච්ඡි.

ඉක්බිති උපාසකයා බඩු සහිත සොරා දැක වේගයෙන් ගොස් ඔහුගේ කෙස්ගෙන මෙපමණ කලක් තෙරුන්ට මා විසින් දෙන ලද සළු ගනිමින් නුඹ සොරකම් කළේදැයි ඇසුවේ ය.

WWW.PIRIVENA.LK

❖ තෙන හි 'ආම සාමී'ති සම්පටිච්ඡිතෙ උපාසකො තස්ස හත්ථතො චීවරවත්ථං ගහෙත්වා හත්ථපාදෙහි තං පොථෙත්වා දුබ්බලං කත්වා ආමකසුසානං නෙත්වා මතමනුස්සං අධොමුඛං කත්වා තස්ස පිට්ඨියං උත්තානං සයාපෙත්වා හත්ථපාදපිට්ඨීතො බන්ධනං අමොචනං කත්වා විසුං විසුං කත්වා දළ්හං බන්ධිත්වා සයාපෙත්වා සයං නහාත්වා පුරිමතරං ගාමමාගම්ම ගාම මජ්ඣෙ ඨත්වා 'භො ගාමවාසිනො මම වචනං සුණාථ අජ්ජරත්තිභාගෙ එකො අමනුස්සො ආගච්ඡති.

ඔහු විසින් එසේය ස්වාමීනි යැයි පිළිගත්කල්හි උපාසකයා ඔහුගේ අතින් සිවුරු රෙදි ගෙන අත්පාවලින් ඌ තලා දුබල කොට අමුසොහොනට පමුණුවා මළමිණියක මුහුණ යටිකුරු කොට ඔහුගේ පිටේ උඩුබැලි අතට නිදවා අත් පා පිටින් බැඳුම ගලවාගත නොහැකි කොට වෙන් වෙන් කොට දැඩි සේ බැඳ නිදවා තමා නා පළමුව ගමට ගොස් ගම මැද සිට පින්වත් ගම්වැසියෙනි මගේ වචනය අසවු. අද රෑ එක් අමනුෂ්‍යයෙක් එයි.

❖ 'සො තුම්හාකං මහාවිනාසං කරිස්සති. ඛෙමට්ඨානං පත්වා ද්වාරානි පිධාය නිසීදථා'ති උග්ඝොසෙසි.

ඔහු නුඹලාට මහා විනාශයක් කරන්නේ ය. ආරක්ෂිත තැනකට පැමිණ දොරවල් වසා නිදව් යැයි ශබ්ද කළේ ය. (මහහඬින් කීය)

2. පාලි භාෂාවෙන් පිළිතුරු සපයන්න.

i. කතරස්මිං රට්ඨෙ මහාතලාකවිහාරො අහොසි ?

සීහළ දීපෙ මහාතලාකවිහාරො අහොසි.

ii. කො ගාමන්තසෙනාසනං පහාය අරඤ්ඤකො අහොසි ?

අභයත්ථෙරො ගාමන්තසෙනාසනං පහාය අරඤ්ඤකො අහොසි.

iii. කො අරඤ්ඤකමහාභයත්ථෙරං පටිජග්ගි ?

එකො උපාසකො අරඤ්ඤකමහාභයත්ථෙරං පටිජග්ගි.

iv. කති වස්සානි සො ථෙරං උපට්ඨහි ?

ද්වාදස වස්සානි සො ථෙරං උපට්ඨහි.

WWW.PIRIVENA.LK

v. හරන්තිකො කිං අකාසි ?

හරන්තිකො සාකටානි චොරෙසි.

vi. උපාසකො බහූසු චීවරෙසු දින්නෙසුපි කස්මා ථෙරො දුබ්බලචීවරො යෙව අහොසි ?

උපාසකො බහූසු චීවරෙසු දින්නෙසුපි 'චොරො රත්තියං ගන්ත්වා චොරෙති' තෙන හෙතුනා ථෙරො දුබ්බලචීවරො යෙව අහොසි.

vii. ථෙරො කෙන කාරණෙන දුබ්බලචීවරොයෙව භවිස්සතීති උපපරික්ඛිතුං උපාසකො කිං අකාසි ?

ථෙරො කෙන කාරණෙන දුබ්බලචීවරොයෙව භවිස්සතීති උපපරික්ඛිතුං උපාසකො මග්ගා ඔක්කම්ම උපපරික්ඛමානො නිලීනො අට්ඨාසි.

viii. මග්ගා ඔක්කම්ම නිලීනෙන උපාසකෙන කිං දිට්ඨං ?

මග්ගා ඔක්කම්ම නිලීනෙන උපාසකෙන සභණ්ඩා චොරො දිට්ඨං.

ix. සභණ්ඩකං චොරං දිස්වා උපාසකො කිං පුච්ඡි ?

සභණ්ඩකං චොරං දිස්වා උපාසකො සාටකානි ගණ්හන්තො ත්වමරෙති පුච්ඡි.

x. උපාසකො ගාමවාසිනං කිං ආහ ?

උපාසකො ගාමවාසිනං අජ්ජ රත්තිභාගෙ එකො අමනුස්සො ආගච්ඡතී'ති ආහ.

3. ඡේදය ඇසුරෙන් සිංහලෙන් පිළිතුරු ලියන්න.

i. ත්‍රිපිටකය නම් කරන්න.

සූත්‍ර පිටකය, අභිධර්ම පිටකය, විනය පිටකය

ii. මහා අභය තෙරුන් වැරහැලි සිවුරු ඇත්තෙක් වීමට හේතුව පැහැදිලි කරන්න.

උපාසකයා පූජා කරන සිවුරු හරන්තික නම් සොරෙකු සොරකම් කිරීම නිසා පෙරවීමට සුදුසු සිවුරක් නොමැති විය.

WWW.PIRIVENA.LK

iii. උපාසකයා අභය තෙරුන්ට වසර කීයක් උවටැන් කළේ ද?

දොළොස් වසරක්

iv. සොරා අල්ලාගත් උපාසකයා ඔහුට කුමක් කළේ ද?

සොරා අල්ලා තලා පෙළා මළමිණියක ගැට ගැසුවේ ය.

v. මෙම ජේදයෙන් උගත හැකි ආදර්ශ ගෙනහැර දක්වන්න.

- අල්පේච්ඡ ජීවිතයක වැදගත්කම
- නොගැළපෙන දේ නොකිරීම (සොරකම වැනි නිහීන ක්‍රියා)
- කළ කළ දේ ඵල ඵල දේ

අභ්‍යාසය

1. සිංහලට නගන්න.

i. මාණව, අහං තෙ සොවණ්ණමයං වා මණිමයං වා රජතමයං වා චක්කයුගං දස්සාමීති බ්‍රාහමණො වදි.

මානවකය, මම නුඹට රනින් හෝ මිණියෙන් හෝ රිදියෙන් හෝ රෝද දෙකක් දෙන්නෙමි'යි බමුණා කීවේ ය.

ii. දයාලු භගවා මහාජනතං අනුකම්පමානො සබ්බදා එකත්‍ථ අවසිත්‍වා තත්‍ථ තත්‍ථ විචරනෙතා සන්දිට්ඨිකං ධම්මං දෙසෙසි.

දයාවැති භාග්‍යවතුන් වහන්සේ මහජනයාට අනුකම්පා කරන්නේ සැමදා එක් තැනක නොහිඳ ඒ ඒ තැන හැසිරෙන්නේ සාන්දෘෂ්ටික ධර්මය දේශනා කළ සේක.

iii. චුල්ලපන්‍ථකො සහස්සක්ඛත්තුං අත්තානං නිම්මිණිත්‍වාන යාව කාලප්පවෙදනා රමෙම අම්බවනෙ නිසීදි.

චුල්ලපන්ථක තෙරණුවෝ දහසක් තමා මවා කල් දනවන තෙක් රම්‍ය අඹ වනයෙහි හුන් සේක.

iv. දාළිද්දියෙ වෙපුලලංගතෙ අදින්නාදානං වෙපුලලමගමාසි.

දිළිඳු බව වැඩි බවට ගිය කල්හි සොරකම වැඩි විය.

WWW.PIRIVENA.LK

v. ගුණවතී උපාසිකා සීලවන්තියා භික්ඛුනියා දිවසස්ස ද්වික්ඛත්තුං දානං අදාසි.

ගුණවත් උපාසිකාව සිල්වත් භික්ෂූණියට දවසට දෙවරක් දානය දුන්නා ය.

2. පාලියට නගන්න.

i. ගිලනබවට පත් රෝගීහු බෙහෙත් අනුභවකොට ආරෝග්‍යය ලැබ තම තමනගේ සොම්නස ප්‍රකාශ කළහ.

ගෙලඤ්ඤා භෙසජ්ජානි භුඤ්ජිත්වා ආරොගයං ලභිත්වා අත්තානං සොමනස්සං පකාසෙසුං/ පකාසිංසු.

ii. ශ්‍රේෂ්ඨ පුරවැසියෝ සැම කල්හි හැමතැනම පහළ නොවෙති.

සෙට්ඨ පුරවාසිනො සදා සබ්බත්ථ න විජ්ජන්ති.

iii. අපි දවසට තුනවරක් බුදුන් වඳිමු.

මයං දිවසස්ස තික්ඛත්තුං බුද්ධං වන්දාම.

iv. පාපතර මිනිස්සු කායික වූ ද වාචසික වූ ද අකුසල් කොට අපායේ උපදිති.

පාපතරා මනුස්සා කායිකං ච වාචසිකං ච අකුසලානි කත්වා නිරයෙ උප්පජ්ජන්ති.

v. සිල්වත් ගුණවත් කුලවත් යසෝදරා කුමරිය සිද්ධාර්ථ කුමරුගේ බිරිඳ වූවා ය.

සීලවා ගුණවා කුලවා යසොධරා කුමාරි සිද්ධත්ථ කුමාරස්ස භරියා අහොසි.

3. දී ඇති ශබ්ද ප්‍රකෘතිය ඇසුරින් නියමිත අර්ථානුකූල තද්ධිත පද නිර්මාණය කරන්න.

i. සුගත (බුදුන් වහන්සේට අයත්) - සොගත

ii. ලොක (ලෝකයට අයත්) - ලොකික

iii. දන්ත (දළ ඇත්තා) - දන්තී

iv. මායා (මායා ඇත්තා) - මායාවී

WWW.PIRIVENA.LK

v. අරෝග (නිරෝගී බව) - අරොගය
vi. කුසල (දක්ෂ බව) - කොසල්ල
vii. ද්වි (දෙකඩකට) - ද්විධා
viii. චතු (සතවරක) - චතුක්ඛත්තුං
ix. එක (එක දවසක්) - එකදා
x. සබ්බ (හැම තැනම) - සබ්බථා

4. පහත තද්ධිත පදවල ප්‍රකෘති ප්‍රත්‍යය වෙන් කර වගුව සම්පූර්ණ කරන්න.

තද්ධිතය	**ප්‍රකෘති ප්‍රත්‍යය**	**තද්ධිත නාමය**	**අර්ථය**
රජ්ජ	රාජ + ණ්‍ය	භාව තද්ධිත	රජ බව
සීලවන්තු	සීල + වන්ත	අස්ත්‍යාර්ථ	සිල් ඇත්තා
යසස්සී	යස + සී	අස්ත්‍යාර්ථ	කීර්තිය ඇත්තා
දුබ්බල්‍යං	දුබ්බල + ණ්‍ය	භාව	දුබල බව
ආධිපතෙය්‍ය	අධිපති + ණෙය්‍ය	භාව	අධිපති භාවය
ඨානසො	ඨාන + සො	සංඛ්‍යා	ස්ථාන ලෙස
කදා	කිං + දා	සංඛ්‍යා	කවදා
ද්වික්ඛත්තුං	ද්වි + ක්ඛත්තුං	අව්‍ය	දෙවරක්
චතුත්ථො	චතු + ථ	සංඛ්‍යා	සිව්වැනි
පඤ්චමො	පඤ්ච + ම	සංඛ්‍යා	පස්වැනි
වණිජ්ජං	වාණිජ + ණ්‍ය	භාව	වාණිජ බව

WWW.PIRIVENA.LK

5.

i. තද්ධිත යන්න හඳුන්වා දෙන්න.

නාමයකට පරව තද්ධිත ප්‍රත්‍යයක් එක් කොට සාදා ගන්නා ලබන ද්විතීක නාමය තද්ධිත නමින් හඳුන්වයි.

ii. තද්ධිතවලින් භාෂාවට ලැබෙන ප්‍රයෝජන මොනවාද ?

භාෂාව විසිතුරු වීම, අර්ථය හරවත් වීම, ව්‍යක්ත බව, උච්චාරණය පහසු වීම, ලේඛනයේ පහසුව, තනි පදයක් වීම

iii. තද්ධිත ප්‍රභේද නම් කරන්න.

අපච්චත්ථ, අනෙකත්ථ, අත්‍යත්ථ, භාව, සංඛ්‍යා, අව්‍ය

iv. තද්ධිතයන්හි වෘද්ධි කාර්යය නිදසුන් මගින් පහදන්න.

සමහර විටෙක තද්ධිත ප්‍රත්‍යය පැමිණීමේ දී පදයේ මුල් ස්වරය වෘද්ධි කාර්යයට බඳුන් වේ. එවැනි අවස්ථා කිහිපයක් පහතින් බලමු.

අ - ආ බවට පත් වේ. සමණ + ණෙර - සාමණෙර

ඉ ඊ - එ බවට පත් වේ. වීණා + ණික - වෙණික

උ ඌ - ඔ බවට පත්වේ - උපගු + ණව - ඔපගව

v. 'කොසලල' යන තද්ධිත පදය සූත්‍ර දක්වමින් සිද්ධ කරන්න.

කුසල + ණ්‍ය - කොසලල

WWW.PIRIVENA.LK

පසළොස්වන පාඩම

තණ්හාය අභිභූතො කුමාරො - තෘෂ්ණාව යටපත් කළ කුමාරයා

අභ්‍යාසය

1. තණ්හාය අභිභූතො කුමාරො ඡේදය සිංහලට පරිවර්තනය කරන්න.

❖ අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තස්ස රඤ්ඤො ද්වෙ පුත්තා අහෙසුං.

අතීතයේ බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජුට පුත්තු දෙදෙනෙක් වූහ.

❖ සො ජෙට්ඨස්ස උපරජ්ජං අදාසි, කණිට්ඨස්ස සෙනාපතිට්ඨානං.

ඔහු වැඩිමලාට උපරජකම දුන්නේ ය. බාලයාට සේනාපතිකම දුන්නේ ය.

❖ අපරභාගෙ බ්‍රහ්මදත්තෙ කාලකතෙ අමච්චා ජෙට්ඨකස්ස අභිසෙකං පට්ඨපෙසුං.

පසුකාලයේ බ්‍රහ්මදත්ත රජු කළුරිය කළ කල්හි ඇමතිවරු වැඩිමලා අභිෂේක කළහ. (රාජ්‍යයට පත් කළහ)

❖ සො 'න මය්හං රජ්ජෙනත්ථො. කණිට්ඨස්ස මෙ දෙථා'ති වත්වා උපරජ්ජාදීනිපි න ඉච්ඡි.

ඔහු මට රජකමෙන් වැඩක් නැත. මගේ බාලයාට දෙව'යි කියා උපරාජ්‍යයත් කැමති නොවීය.

❖ 'තෙන හි සාධූනි භොජනානි භුඤ්ජන්තො ඉධෙව වසාහී'ති වුත්තෙපි 'න මෙ ඉමස්මිං නගරෙ කිච්චං අත්ථී' ති බාරාණසිතො නික්ඛමිත්වා පච්චන්තං ගන්ත්වා එකං සෙට්ඨිකුලං නිස්සාය සහත්ථෙන කම්මං කරොන්තො වසි.

එසේ නම් මැනවැයි භෝජන අනුභව කරමින් මෙහි ම වසවයි කී කල්හිත් මට මේ නගරයෙහි වැඩක් නැත.

WWW.PIRIVENA.LK

බරණැසින් නික්ම පසල් දනව්වකට ගොස් එක් සිටු කුලයක් නිසා සිය අතින් වැඩ කරමින් විසී ය.

❖ තෙ අපරභාගෙ තස්ස රාජකුමාරභාවං ඤත්වා කම්මං කාතුං නාදංසු.

ඔහු පසුකාලයේ කුමරා බව දැන වැඩ කිරීමට නොදුන්හ.

❖ කුමාරපරිහාරෙනෙව තං පරිහරිංසු.

ඔහු කුමාරයා යන හැඟීමෙන් වැඩ කළහ.

❖ අපරභාගෙ රාජකම්මිකා ඛෙත්තප්පමාණගහණත්ථාය තං ගාමං අගමිංසු.

පසුකාලයක රාජසේවකයෝ කුඹුරු සඳහා බදු ගැනීම පිණිස ඒ ගමට ගියහ.

❖ සෙට්ඨි රාජකුමාරං උපසඞ්කමිත්වා 'සාමි, මයං තුම්හෙ පොසෙම.

සිටුවරයා රාජකුමාරයා වෙත පැමිණ 'දේවයිනි අපි නුඹලා පෝෂණය කරමු'

❖ කණිට්ඨභාතිකස්ස පණ්ණං පෙසෙත්වා අම්හාකං බලිං හාරෙථා'ති ආහ.

බාලසොයුරාට ලිපියක් යවා අපගේ බදු ලබාගන්නැයි කීවේ ය.

❖ සො සාධූ'ති සම්පටිච්ඡිත්වා අහං අසුකසෙට්ඨිකුලං නාම උපනිස්සාය වසාමි.

ඔහු යහපතැයි පිළිගෙන මම අසවල් සිටු කුලයක් නිසා වසමි.

❖ මං නිස්සාය එතෙසං බලිං විස්සජ්ජෙහී'ති පණ්ණං පෙසෙසි.

මා නිසා මේ බදු විසුරුවන්නැයි ලිපියක් යැවී ය.

❖ රාජා 'සාධූ'ති වත්වා තථා කාරෙසි.

රජතුමා යහපතැයි කියා එසේ කළේ ය.

WWW.PIRIVENA.LK

❖ අථ නං සකලගාමවාසිනොපි ජනපදවාසිනොපි උපසඞ්කමිත්වා 'මයං තුම්හාකඤ්ඤෙව බලිං දස්සාම, අම්හාකම්පි සුඛකං විස්සජ්ජාපෙහී'ති ආහංසු. සො තෙසම්පි අත්ථාය පණ්ණං පෙසෙත්වා විස්සජ්ජාපෙසි.

ඉක්බිති ඒ සියලු ගම්වැසියොත් ජනපදවැසියොත් පැමිණ අප නුඹට අයබදු දෙමු. අපටත් අයබදු අත්හරුවයි කීවාහුය. ඔහු ඔවුන්ට ද ලිපියක් ලියා අත් හැරවී ය.

❖ තතො පට්ඨාය තෙ තස්සෙව බලිං අදංසු.

එතැන් පටන් ඔවුහු ඔහුට ම බදු දුන්හ.

❖ අථස්ස මහාලාභසක්කාරො නිබ්බත්ති.

ඉක්බිති ඔහුට මහා ලාබ සත්කාර උපන්නේ ය.

❖ තෙන සද්ධිං යෙවස්ස තණ්හාපි මහතී ජාතා.

ඒ සමගම තණ්හාව මහත්ව උපනි.

❖ සො අපරභාගෙ සබ්බං තං ජනපදං යාචි.

ඔහු පසුකලෙක ඒ සියලු ජනපදය ඉල්ලී ය.

❖ උපඩ්ඪරජ්ජං යාචි.

උපරජකම ඉල්ලී ය.

❖ කණිට්ඨොපි තස්ස අදාසියෙව.

බාලයාත් ඔහුට දුන්නේ ම ය.

❖ සො තණ්හාය වඩ්ඪමානාය උපඩ්ඪරජ්ජෙනපි අසන්තුට්ඨො රජ්ජං ගණ්හිස්සාමී'ති ජනපදපරිවුතො තං නගරං ගන්ත්වා බහිනගරෙ ඨත්වා රජ්ජං වා මෙ දෙතු යුද්ධං වා'ති කණිට්ඨස්ස පණ්ණං පහිණි.

ඔහු තණ්හාව වැඩෙන්නනේ උපරජකමිනුත් නො සතුටු සිත් ඇත්තේ රාජ්‍ය ගන්නෙමියි ජනපදය පිරිවරන ලද්දේ ඒ නගරය ගෙන පිට නගරයෙහි සිට රාජ්‍ය හෝ දෙවයි යුද්ධය හෝ වේවයි බාලයාට ලිපියක් යැවී ය.

WWW.PIRIVENA.LK

❖ කණිට්ඨො චින්තෙසි.

බාලයා සිතුවේ ය.

❖ 'අයං බාලො පුබ්බෙ රජ්ජම්පි උපරජ්ජාදීනිපි පටික්ඛිපිත්වා ඉදානි 'යුද්ධෙන ගණ්හාමී'ති වදති.

මේ බාලයා පෙර රාජ්‍යයත් උපරාජ්‍යයත් ප්‍රතික්ෂේප කොට දැන් යුද්ධයෙන් ගනිමි යි කියයි.

❖ සචෙ බො පනාහං ඉමං යුද්ධෙන මාරෙස්සාමි ගරහා මෙ භවිස්සති.

ඉඳින් මම වනාහි මේ යුද්ධයෙන් මැරෙන්නෙමි නම් නින්දාවක් වන්නේ ය.

❖ කිං මෙ රජ්ජෙනාති. අථස්ස 'අලං යුද්ධෙන, රජ්ජං ගණ්හාතූ'ති පෙසෙසි.

මට රාජ්‍යයෙන් කිම. යුද්ධයෙන් වැඩක් නැත, රාජ්‍යය ගනුවයි යැවී ය.

❖ සො රජ්ජං ගණ්හිත්වා කණිට්ඨස්ස උපරජ්ජං දත්වා තතො පට්ඨාය රජ්ජං කරොන්තො තණ්හාවසිකො හුත්වා එකෙන රජ්ජෙන අසන්තුට්ඨො ද්වෙ තීණි රජ්ජානි පත්ථෙත්වා තණ්හාය කොටිං නාද්දස.

ඔහු රාජ්‍යය ගෙන බාලයාට යුවරජකම දී එතැන් පටන් රජ කරමින් තණ්හාවට වසඟ වී එක් රාජ්‍යයකින් නොසතුටු වී රාජධානි දෙක තුන පතා තණ්හාවේ කෙළවරක් නොදුටුවේ ය.

02. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. බ්‍රහ්මදත්තස්ස රඤ්ඤො කිත්තකා පුත්තා අහෙසුං ?

බ්‍රහ්මදත්තස්ස රඤ්ඤො ද්වෙ පුත්තා අහෙසුං.

ii. සො කස්ස උපරජ්ජං අදාසි කස්ස සෙනාපතිට්ඨානං ?

සො ජෙට්ඨකස්ස උපරජ්ජං අදාසි කණිට්ඨස්ස සෙනාපතිට්ඨානං.

WWW.PIRIVENA.LK

iii. අමච්චා කං අභිසෙකං පට්ඨපෙසුං ?

අමච්චා ජෙට්ඨකස්ස අභිසෙකං පට්ඨපෙසුං.

iv. රාජකම්මිකානි කෙ ?

රාජකම්මිකානි රාජසෙවකා.

v. ජෙට්ඨකුමාරො රජ්ජං යාචිත්වා කණිට්ඨස්ස පණ්ණං පෙසිතෙ සො කිර චින්තෙසි ?

ජෙට්ඨකුමාරො රජ්ජං යාචිත්වා කණිට්ඨස්ස පණ්ණං පෙසිතෙ සො 'අහං ඉමං යුද්ධෙන මාරෙස්සාමි ගරහා මෙ භවිස්සතීති චින්තෙසි.

03. සිංහලයෙන් පිළිතුරු සපයන්න.

i. බරණැස් නුවර හා ගෞතම බුදුසසුන අතර ඇති සම්බන්ධය කුමක් ද?

පළමු ධර්ම දේශනාව බරණැස් නුවර ඉසිපතන මිගදායේ දී සිදු කිරීම

භික්ෂු සාසනයේ ආරම්භය සිදු වූ ස්ථානය

ii. ඉපැරණි රාජ්‍යයක ප්‍රධාන තනතුරු තුනක් නම් කරන්න.

රජ, යුවරජ, සේනාපති, මහ ඇමති

iii. මුළුමනින්ම මුල නොසිඳූ ගස නැවත වැඩෙන්නා සේ සැඟව ඇති තණ්හාව ද වැඩෙන බව මෙම කතා පුවතින් කියවේ. මෙම අදහස ඇති ධම්මපද ගාථාව සොයා ලියන්න.

යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ

ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති

එවම්පි තණ්හානුසයෙ අනූහතෙ

නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං

WWW.PIRIVENA.LK

iv. මෙම පාඩමේ සඳහන් සන්ධි පද හතරක් හා සමාස පද දෙකක් උපුටා දක්වන්න.

සමාස - බ්‍රහමදතත, සෙටඨිකුලං

සන්ධි - වුතෙතපි, සාධූති, සෙනාපතිටඨානං, දෙථා'ති

v. කම් නැත, නොහොත් වැඩක් නැත. මෙම අදහස ඇති නිපාත පදය පාඩමෙන් තෝරා ලියන්න.

අලං

04. ඉහත පාලි ඡේදයේ වාක්‍ය රටාව අනුගමනය කරමින් මේ වාක්‍ය පාලියට නගන්න.

i. පෙර ලක්දිව කාවන්තිස්ස රජුට පුත්තු දෙදෙනෙක් වූහ.

අතීතෙ ලංකාදීපෙ කාකවණ්ණතිසස රඤ්ඤො දෙව පුතතා අහෙසුං.

ii. ඒ රජු වැඩිමහලලාට යුවරජකම ද බාලයාට සේනාපති තනතුර ද දුන්නේ ය.

සො ජෙටඨසස උපරජ්ජං අදාස, කණිටඨසස සෙනාපතිටඨානං.

iii. පසුකලෙක කාවන්තිස්ස රජු කුමාරවරුන් දෙදෙනා කැඳවා 'යුද්ධයෙන් වැඩක් නැත' එළාර සමග යුද්ධ නොකරන්නැ'යි ඉල්ලී ය.

අපරභාගෙ කාකවණ්ණතිසස රාජා කුමාරෙ ආමනෙතතවා අලං යුදෙධන එළාරෙන සද්ධිං මා යුජ්ඣිසසථා'ති යාචි.

iv. කෝපාවිෂ්ට වූ වැඩිමහල්ලා 'මට යුවරජකමෙන් එලක් නැතැයි කියා ජන පදයෙන් නික්මී පිටිසර පළාතකට පැන ගියේ ය.

කොපාවිටෙඨා ජෙටඨකො න මයහං උපරජ්ජෙනතෙථා'ති වතවා ජනපදතො නිකඛමිතවා පචචනතං අගමි.

v. රජු මිය ගිය කල්හි ඇමතියෝ කුමාරවරුන් කැඳවා වැඩිමහල්ලාට රජකම ද බාලයාට යුවරජකම ද ලබාදුන්හ.

WWW.PIRIVENA.LK

රාජිම්හි කාලකතෙ අමච්චා කුමාරෙ ආමන්තෙත්වා ජෙට්ඨකස්ස රජ්ජං ච කණිට්ඨකස්ස උපරජ්ජං ච පට්ඨපෙසුං.

vi. බාලකුමාරයා දීඝවාපියට ගොස් සියතින් වැඩ කරමින් කුඹුරු සීසාමින් සේනාව රැස් කරමින් වාසය කළේ ය.

කණිට්ඨකුමාරො දීඝවාපිං ගන්ත්වා සහත්ථෙන කම්මං කරොන්තො ඛෙත්තං කසන්තො සෙනා සංවිධානන්තො වසි.

අභ්‍යාසය

01. සිංහලට නගන්න.

i. අන්නං පානං ඛාදනීයං භොජනං ච මහාරහං - භුඤ්ජති සපරිවාරො නිච්ඡාරොන්තො නිලීයති.

මහාර්ඝ ආහාර පාන කැවිලි භෝජන ද මහත්පිරිවරින් වළඳයි. බැහැර කරන කල්හි සැඟවෙයි.

ii. උපාසකො ධම්මං සුත්වා නගරං පවිසන්තො සත්ථු ගුණකථං කථෙන්තොව පවිසති.

උපාසකයා ධර්මය අසා නගරයට පිවිසෙන්නේ බුදුගුණ කතාව කියමින් ම පිවිසෙයි.

iii. සුමෙධපණ්ඩිතො උපරිපාසාදවරතලෙ රහොගතො හුත්වා පල්ලඞ්කං ආභුජිත්වා නිසින්නො චින්තෙසි.

සුමේධ පණ්ඩිතයා ප්‍රාසාදයෙහි ඉහළ ම මහළෙහි විවේකයට පත් වී කකුල් ගොතා පළඟක් බැඳ හුන්නේ සිතුවේ ය.

iv. චක්කවත්තිරාජා ධම්මංයෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරු කරොන්තො ධම්මං මානෙන්තො ධම්මං පූජෙන්තො ධම්මං අපචායමානො රජ්ජමකාසි.

WWW.PIRIVENA.LK

සක්විති රජතුමා ධර්මයෙහිම හුන්නේ ධර්මයට සත්කාර කරමින් ධර්මයට ගරු කරමින් ධර්මයට පූජා කරමින් ධර්මයට වතාවත් කරමින් රජ කළේ ය.

v. තාත සුදින්න, භුඤ්ජ ච පිව ච පරිචාරෙහිච භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමෙ පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු.

දරුව සුදින්න, කෑම ද බීම ද හැසිරීම ද වළඳමින් බොමින් හැසිරෙමින් කාමයන් පරිභෝග කරමින් පින් කරමින් සතුටින් කල් යවන්න.

vi. තිණ්ණො සො භගවා තරණාය ධම්මං දෙසෙති.

එතෙර වූ ඒ භාග්‍යවතුන් වහන්සේ එතෙර වීම පිණිස ධර්මය දේශනා කරති.

vii. පරපටිබද්ධා මෙ ජීවිකාති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

මගේ ජීවිතය අනුන් සඳහා යැයි පැවිද්දා විසින් නිරන්තර සිහි කළ යුතු ය.

viii. ඛජ්ජ භොජ්ජ ලෙය්‍ය පෙය්‍ය වසෙන චතුබ්බිධා හොන්ති මනුස්සානං ආහාරා.

කෑයුතු බියයුතු ලෙවකෑම් ලෙවබීම් වශයෙන් මිනිසුන්ගේ ආහාර සිව් ආකාර වෙයි.

ix. අභික්කන්තං භො ගොතම. අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය.

විශිෂ්ටයි භවත් ගෞතමයන් වහන්ස, විශිෂ්ටයි පින්වත් ගෞතමයන් වහන්ස, යටිකුරු කළෙකක් උඩුකුරු කළේ යම් සේ ද වැසූවක් විවර කළේ යම් සේ ද.

x. සචෙ උපජ්ඣායො ජන්තාඝරං පවිසිතුකාමො හොති. චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා.

ඉදින් උපාධ්‍යයන් වහන්සේ ගිනිහල්ගෙට පිවිසීමට කැමති වන්නේ වෙයි නම් හුණු මිශ්‍ර කොට තැබිය යුතු ය. මැටි බඳුන් තෙත් කළ යුතු ය.

WWW.PIRIVENA.LK

02. පාලියට නගන්න.

i. සැදැහැයෙන් පැවිදි වූවන් විසින් ධර්මය උගත යුතු ය. බුදුන් වැන්ද යුතු ය.

සද්ධෙහි පබ්බජිතෙහි ධම්මං උග්ගණ්හිතබ්බං බුද්ධං වන්දිතබ්බං

ii. අප විසින් පින් කළ යුතු ය. සිල් රැකිය යුතුය. වත් පිරිය යුතුය.

මයා පුඤ්ඤානි කත්තබ්බං, සීලානි රක්ඛිතබ්බං, වත්තානි පූරෙතබ්බං.

iii. මහාකාශ්‍යප තෙරණුවෝ රහසිගතව ධර්මය දෙස බලමින් වනයෙහි කල් යෙවූහ.

මහාකස්සපත්ථෙරො රහොගතො හුත්වා ධම්මං පස්සන්තො වනෙ නිසීදි.

iv. මහණෙනි, නැටුම ආර්ය විනයෙහි උමතුවකත් වැනි ය.

උම්මත්තකමිදං අරියස්ස විනයෙ යදිදං නච්චං

v. තෙරණුවෝ නැගිට දොර විවර කොට කාලය බලන්නේ අලුයම යැයි දැන පාසිවුරු ගෙන ගමට පිවිසියහ.

ථෙරො උට්ඨාය ද්වාරං විවරිත්වා කාලං පස්සන්තො පච්ඡිමයාමං'ති ඤත්වා පත්තචීවරමාදාය ගාමං පාවිසි.

03. සුදුසු අතීත කෘදන්ත පද යොදා හිස්තැන් පුරවන්න.

(ජාතං, හිනෙනා, ජාතො, නිබ්බුතො, නිබ්බුතා, ගතො, පතිතං, ගතො, බුභිතො (සැළුණෙ), පතිතො)

i. භික්ඛුසංඝො <u>නිබ්බුතො</u>

ii. රාහුලො <u>ජාතො</u>

iii. බන්ධනං <u>ජාතං</u>

WWW.PIRIVENA.LK

iv. සා නාරී <u>නිබ්බුතා</u>

v. සො පිතා <u>ගතො</u>

vi. සො ගාමං <u>ගතො</u>

vii. ඵලං රුක්ඛම්හා <u>පතිතං</u>

viii. දෙවදත්තො නිරයං <u>පතිතො</u>

ix. සමුද්දො <u>භින්නො</u>

x. රුක්ඛො වාතප්පහාරෙන <u>භූහිතො</u>

04. මෙම පාඩමේ එන සියලු කිතක පද තෝරා පහත එන පරිදි වගු ගත කරන්න.

ත්‍රෛකාලික කිතක	**අතීත කිතක**	**වර්තමාන කිතක**
දාතබ්බං	කතං	පෙක්ඛමානො
	ජාතා	වඩ්ඪමානා
	අසන්තුට්ඨා	භුඤ්ජන්තා
	අභිභූතො	කරොන්තා
	කාලකතෙ	

05. පහත සඳහන් ධාතුන් උපයෝගි කරගෙන දී ඇති ප්‍රත්‍යය යොදා කිතක පද සාදන්න.

ධාතුව	**තබ්බ**	**අනීය**	**මාන**	**අන්ත**	**ත**
වන්ද	වන්දිතබ්බ	වන්දනීය	වන්දමාන	වන්දන්ත	වන්දිත
කර	කත්තබ්බ	කරණීය	කුරුමාන	කරොන්ත	කත

WWW.PIRIVENA.LK

දා	දාතබ්බ	දදනීය	දදමාන	දදන්ත	දත්ත
නමු	නමිතබ්බ	නමනීය	නමමාන	නමන්ත	නමිත
පත	පතිතබ්බ	පතනීය	පතමාන	පතන්ත	පතිත
හර	හරිතබ්බ	හරනීය	හරමාන	හරන්ත	හරිත

WWW.PIRIVENA.LK

දහසය වන පාඩම

පාලි පාඨාවලී

1. මච්ඡරියබ්‍රාහමණො

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. අදින්නපුබ්බක බමුණා පුතාට පළඳනාවක සකස් කළේ කෙසේ ද?

- රන් කැබැල්ලක් තලා

ii. එම බමුණාගේ පුතාට පටබැඳුණු නම කුමක් ද? එසේ වූයේ ඇයි ?

- මට්ටකුණ්ඩලී, රන් කැබැල්ලක් තලා මට්ටම් කොට මාලයක් සකසා ගෙළේ බැඳි නිසා

iii. මරණාසන්න පුතා තැබුවේ කොහිද?

- ආලින්දයෙන් පිටත

iv. ගෙදරට පැමිණි වෛද්‍යවරයා දුන් උපදේශය කුමක් ද?

- මට වෙනත් කාර්යයක් ඇත. වෙන වෙදෙකු ලවා පරීක්ෂා කරගන්න.

v. පුතාට පියා විසින් බෙහෙත් කළ අයුරු පැහැදිලි කරන්න.

- ධනයට ඇති ලෝභකම නිසා වෛද්‍යවරයෙකුට නොපෙන්වා වෛද්‍යවරුන් ළඟට ගොස් ඔවුන්ගෙන් එක් එක් රෝග පිළිබඳ අසා ඔවුන් කියන විවිධාකාර වූ බෙහෙත් සකසා පුතුට දීම

vi. මෙම පාඩමෙන් දෙන උපදේශය ලියන්න.

- ලෝභකම පරිහානියට/ වේදනාවට හේතු වේ.
- සුදුස්සා සුදුසු කල්හිම කරන්න.

WWW.PIRIVENA.LK

2.අකාරුණිකො වෙජ්ජො

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඇස් දුර්වල ස්ත්‍රියගෙන් වෛද්‍යවරයා ඇසුවේ කුමක් ද?

- කුමක්ද නුඹේ අපහසුව? යනුවෙන්.

ii. දෑස් සුව වුවහොත් කුමක් කිරීමට අඳ ස්ත්‍රිය පොරොන්දු වූවා ද?

- තම දියණිය සමඟ වෛද්‍යවරයාගේ නිවසේ මෙහෙකාර සේවය කිරීමට පොරොන්දු විය.

iii. දෙවැනි වරට ද ඇසට බෙහෙත් දුන්නේ ඇයි ?

- ඇය කෙරෙහි උපන් වෛරයෙන් හා ඇස් අන්ධ කිරීමේ අරමුණින්

iv. පෙරට වඩා බෙහෙත් ගැල්වීමෙන් ඇස රිදෙන බව ස්ත්‍රිය පැවසුවේ කුමක් නිසා ද?

- තමාත් දියණියත් මෙහෙකාර සේවයෙන් මිදීම පිණිස. ඇස් සුව වූ පසු ඇයත් දියණියත් ඔහුගේ නිවසේ මෙහෙකාර සේවය කරන බවට පෙර පොරොන්දුවක් වූවා ය.

v. වෛද්‍යවරයාගේ බිරිඳ කීවේ කුමක් ද?

- ඇය කිසිවක් නොකියා (නිශ්ශබ්දව) කරුණ අනුමත කළාක් මෙන් සිටියා ය.

vi. මෙම කථාවෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියා දක්වන්න.

- බොරුව, වංචාව නොකළ යුතු බව (සත්‍යවාදී විය යුතු බව)

- පොරොන්දු ඉටු කිරීමේ ගුණය

WWW.PIRIVENA.LK

3. බුද්ධුපට්ඨාකා දෙව තිරච්ඡානා

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඇතා බුදුරදුන්ට වැඩ හිඳීමට ස්ථානයක් සකස් කළේ කෙසේ ද?

- පයෙන් පහර ගසමින් ගස් මුල පිරිසිදු කිරීම, සොඬින් අත්තක් ගෙන ඇමදීම

ii. ඇතා විසින් උණුවතුර සම්පාදනය කළ ආකාරය පැහැදිලි කරන්න.

- දර එකට ගටා ගිනි උපදවයි. එහි දර දමමින් දල්වා ඒ ඒ තැන ගල් රත්කර දරකඩකින් පෙරලා කුඩා ගල් පොකුණක දමයි. ඉන්පසු සොඬය දමා වතුර රත් වූ බව දැන ගොස් බුදුරදුන්ට වඳියි.

iii. වඳුරා මීවදය පිළිගැන්වූයේ කුමක තබා ද?

- කෙසෙල් කොළයක තබා

iv. බුදුරදුන් සමග ඇතා පසුගමන් ගියේ කුමන අවස්ථාවල දී ද?

- බුදුරජාණන් වහන්සේ පිණ්ඩපාතයේ වඩින විට

4. උජුජාතිකො සුනඛො

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පසේ බුදුරදුන් දන් වළඳා අවසන්හි දිනපතා කළේ කුමක් ද?

- බල්ලාට බත් පිඩක් ලබා දීම

ii. ගොපල්ලා දිනකට කී වතාවක් බුදුරදුන් වෙත යන්නේ ද?

- දිනකට දෙවරක්

WWW.PIRIVENA.LK

iii. බල්ලා බුදුරදුන් වැඩම වීමට පැමිණ කළේ කුමක් ද?

- අරමට පැමිණ තෙවරක් බිරීම

iv. වැරදි මගට පිළිපන් පසේ බුදුරදුන්ට බල්ලා මග කියා දුන් අවස්ථා කීය ද? එම අවස්ථා ලියන්න.

- එක් අවස්ථාවක අන් මඟකට වැඩම කිරීම, එවිට බල්ලා බුරා ඉදිරියෙන් හරස් කිරීම හා නියමිත මාවතට යොමු කිරීම
- දෙවැනි දවසක බල්ලා බිරුවද අන් මාවතක යෑම, බල්ලා මග හරස් කළ ද නොනැවතී වැඩම කරන බැවින් අඳනට ඇද සපා යායුතු මාවත පෙන්වීම

v. අවසානයේ බල්ලාට සිදු වූයේ කුමක් ද?

- පසේබුදුරදුන්ගේ නික්මීමෙන් වේදනාවට පත් වී ළය පැලී ජීවිතක්ෂයට පත් විය.

vi. කථාවේ උපදේශය ලියා දක්වන්න.

- අවංක වීම ඉතා වටී
- කළගුණ සැලකීමේ උතුම් අගය

5. කතඤ්ඤූ සිගාලො

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සිවලාට 'කාණ සිගාල' යන නම ලැබුණේ කෙසේ ද?

- ඉත්තෑවාගේ කුරු වැදී ඇසක් තුවාල වී අන්ධ වීම නිසා

ii. සිවලා පිඹුරාගෙන් බේරාගත්තේ කවුද?

- ගොපල්ලා

iii. සිවලා ගොවියාගේ වස්ත්‍රය රැගෙන යාමට හේතුව කුමක් ද?

WWW.PIRIVENA.LK

- පිඹුරා අල්ලාගෙන සිටින ගොපල්ලා උගෙන් මුදවා ගැනීමේ අරමුණ

iv. පිඹුරා මරා දැමූයේ කවු ද?

- කුඹුරේ වැඩ කළ ගොවියන්

v. මෙම කතාවෙන් දෙන උපදේශය කුමක් ද?

- කෘතෝපකාරයේ වටිනාකම
- කළගුණ සැලකීම
- උපකාර කළ යුතු අවස්ථාව මග නොහැරීම

6. කතවෙදි සුනබො

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. බමුණා අතරමග දී දුටුවේ කුමක් ද?

- ශාලාවක කුෂ්ඨරෝගී බල්ලෙකු

ii. බමුණා ගිහිගෙය ගැන කළකිරුණේ ඇයි ?

- තමාට දාව ඉපදුණු දරුවා බිරිඳගේ කුසින් ප්‍රසූත කරන කල්හි මියයෑම හා සැතකින් ශරීර කොටස් පිටතට ගැනීමේ දී ඒ දැක කළකිරීම

iii. බිරිඳ තම පෙර සැමියා මැරීමට සිතුවේ කවර හෙයින් ද?

- තමා අතහැර ගොස් පැවිදි වීම නිසා ඇතිවූ වෛරය නිසා

iv. තාපසයා මැරීමට කළ කුමන්ත්‍රණය අසාර්ථක වීමට හේතුව කුමක් ද?

- බල්ලා දෙවැනි සැමියාගේ දුණු හී ආදිය කා දැමීම හා අවසන් අවස්ථාවෙහි පාදය හා මුහුණ සපා කෑම

v. කතාවෙන් ඉගැන්වෙන සාරධර්ම තුනක් ලියන්න.

- කළගුණ සැලකීමේ උත්තරීතර ගුණය

WWW.PIRIVENA.LK

- රෝගීන්ට උපස්ථාන කිරීමේ වටිනාකම
- සුදුසු අවස්ථාවේ දී උපකාරී අයෙකු වීම

7. නකුලඋපාසකස්ස වත්ථු

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. උපාසක තෙම දියණිය නිවසක රැඳවූයේ කහවණු කීයක් ලබාගෙන ද?

- කහවණු 12ක්

ii. නැවත එන අතරමග දී උපාසක තෙම කළ විශේෂ කටයුත්ත කුමක් ද?

- තිස්සමහවෙහෙර වැසි චුල්ලපිණ්ඩපාතික තෙරුන්ට දන් පිළිගැන්වූ අයුරුත් ඉන්න තෙරුන් රහත් බවට පත් වූ ආකාරයත් එකී විහාරයේ වාසය කරන අනෙක් භික්ෂූන් වහන්සේලාට පැවසීම

iii. පිණ්ඩපාතය ලද තෙරණුවෝ කළේ කුමක් ද?

- ගසක් මුලට වැඩම කොට දානය වැළඳීම

iv. තෙරුන් වහන්සේ පිරිනි වී මොහොතේ කුමක් අධිෂ්ඨාන කළ සේක් ද?

- යම් දිනෙක මා පිරිනිවී නම් එදිනට මා වැඩහිඳින මේ කුළු ගෙය අන් කවරෙකු හෝ එසවීයේ නමුත් ඉහළ නොනැගේවා මේ උපාසක තෙමේ ඔසවයි වී නම් එකල්හි උඩට එසවේවා යනුවෙනි.

v. මෙම කථා පුවතින් භික්ෂු ජීවිතයට ගත හැකි ආදර්ශ මොනවාද ?

- අල්පේච්ඡ ජීවිතයක වැදගත්කම
- දුක සැප දෙක සමව ඉවසීම

8. අඤ්ඤසං කතො අනත්ථො අත්තනො උපරි පතිස්සති

WWW.PIRIVENA.LK

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඇවිදගෙන ගිය වෛද්‍යවරයා ගම්දොරටුවෙහි දී දුටුවේ කුමක් ද?
 - ක්‍රීඩා කරන කුමාරවරුන්

ii. කුමාරයා අතට ගත් සර්පයාට කළේ කුමක් ද?
 - සර්පයා වෙදා වෙතට විසි කිරීම

iii. තෙරුන් වහන්සේ දුටු වැද්දාට සිතුණේ මොනවා ද?
 - තෙරුන් දැක 'මා විසින් කාලකණ්ණියෙක් දක්නා ලදි යැයි කිපීම

iv. තමා වෙත එන සුනඛයන් දුටු තෙරණුවෝ කුමක් කළේ ද?
 - එක් ගසකට නැගීම

v. අවසානයේ වැද්දාට සිදු වූයේ කුමක් ද?
 - වැද්දාගේ මුළු සිරුරම සිවුරෙන් වැසීමත් සමග ඔහු ගසෙන් බිමට වැටීම. බිම වැටුණේ තෙරුන් යැයි සිතා බල්ලන් වැද්දා ඉරා කා ඇට පමණක් ඉතිරි කිරීම (වැද්දා ජීවිතක්ෂයට පත්විය)

vi. මෙම කතාවෙන් ඉගැන්වෙන ජීවිතාදර්ශ දෙකක් ලියන්න.
 - අනුන්ට කරන අනර්ථය තමා පසුපසම පැමිණේ
 - අවැඩක් කර ලබන දේහි වටිනාකමක් නැත
 - වැරදි ජීවිකාව පරිහානියට හේතුවේ

9. මුඛරභාවස්ස දොසො

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කොර මිනිසාට තිබූ විශේෂ හැකියාව කුමක් ද?
 - ගල් කැට ඉලක්කයට විදීමේ හැකියාව

ii. එම මිනිසාට රජු පැවරූ කාර්යය කුමක් ද?

WWW.PIRIVENA.LK

- පුරෝහිතගේ දොඩමළු ස්වරූපය බාධාවක් වී ඇති බැවින් ඔහුගේ මුඛයට නැළියක් පමණ එළුබෙටි විදීමේ කාර්යය

iii. පුරෝහිතයාගේ තිබූ දුර්වලතාව කුමක් ද?

- වාචාලකම

iv. කතාවෙන් හැඟවෙන සාහිත්‍ය රසය කුමක් ද?

- හාස්‍ය රසය

v. මෙම කථාවේ ඇති ආදර්ශය කුමක් ද?

- වාචාලකම නුසුදුසු බව
- තැනට සුදුසු නුවණ භාවිත කිරීම

10. පණ්ඩිත අතිපණ්ඩිත වාණිජා

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මෙහි ඇති වෙළෙඳුන් දෙදෙනාගේ නම් මොනවාද?

- පණ්ඩිත, අතිපණ්ඩිත

ii. වෙළෙඳුන් දෙදෙනා අතර කලහය ඇති වූයේ කුමක් සඳහා ද?

- භාණ්ඩ බෙදීම සම්බන්ධයෙනි. අතිපණ්ඩිත තමා අතිපණ්ඩිත බැවින් කොටස් තුනක් කොට එයින් දෙකොටසක් තමන්ට අයත් විය යුතු බව කීවේ ය.

iii. ලද ලාභ බෙදාගැනීමේ තීන්දුව ලබා ගැනීමට කුට උපාය කුමක් ද?

- අතිපණ්ඩිතගේ පියා ගස්බෙනයක ඇතුළු කර ඔවුන් පැමිණි කල අතිපණ්ඩිත භාණ්ඩවලින් හා අනෙකුත් වස්තුවෙන් දෙකොටසක් ලැබීමට සුදුසු බව ප්‍රකාශ කරවීම

iv. ගස් බෙනයේ සිටියේ කවුරු ද?

- අතිපණ්ඩිතගේ පියා

v. මෙම කථාවෙන් දෙන්නා වූ ආදර්ශය මොනවා ද?

WWW.PIRIVENA.LK

- තණ්හාව විපත ගෙන දෙයි

WWW.PIRIVENA.LK

දාහත්වැනි පාඩම

මහාවංසය

අභ්‍යාසය

1. සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

i. පාලි වංසකථා සාහිත්‍යයේ ආදිතම වංසකථාව බුද්ධවංසය යි.

ii. දීපවංසය අටුවා යුගයට පෙර ලියන ලද්දකි.

iii. අනාගත වංසය මෛත්‍රී බුදුනගේ පහළවීම පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

iv. දීපවංසයේ ප්‍රථමභාගයේ ගාථා 1350 කි.

v. දාඨාවංසය රචනා කිරීමට ආරාධනා කළේ පරාක්‍රම සෙන්පතියා ය.

2. මහාවංසය යන්නෙහි අර්ථය ලියන්න.

ගුණයෙන් මහත් වූ සම්බුද්ධ පච්චේක බුද්ධ ශ්‍රාවක සංඝයාගේ පරම්පරාව හෝ මහාසම්මතාදී රජදරුවන්ගේ පරම්පරාව මහාවංසය වේ.

3. කතුවරයා මහාවංසය රචනා කිරීමෙන් බලාපොරොත්තු වූ කරුණු මොනවා ද?

- පෙර ලියූ කෘතිවල පුනරුක්ත වැඩි බැවින් දෝෂ සහිත වීම නිසා එවැනි දෝෂ තැන් නිර්දෝෂ කිරීම
- සිංහලයාගේ අවිච්ඡින්න ඉතිහාසය දැක්වීම
- ශෝත්‍රෘ ජන පහන් සංවේදය ඇති කිරීම
- ජනප්‍රවාදයෙහි එන්නා වූ ඉතිහාස ප්‍රවෘත්ති ලියා තැබීම

4. මහාවංසයේ ප්‍රථම භාගයේ අන්තර්ගතය සැකෙවින් දක්වන්න.

මහා වංසයේ මුල් කොටසේ සම්බුද්ධාගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් කරුණු ඉදිරිපත් කොට ඇත.

WWW.PIRIVENA.LK

ඒවා පරිච්ඡේද 37කින් යුක්ත ය. එකී පරිච්ඡේද අතුරින් වැඩි වශයෙන්ම පරිච්ඡේද වෙන්කර ඇත්තේ දුටුගැමුණු රජතුමා වර්ණනා කිරීම කෙරෙහි ය. එය පරිච්ඡේද 11කි.

බුදුහිමියන්ගේ පළමු ලංකාගමනයේ සිට තොරතුරු, මහාසම්මත රාජ්‍ය වංශය, පළමු දෙවැනි තෙවැනි ධර්ම සංගායනා පිළිබඳ තොරතුරු, විජයාගමනය, විජය රජුගේ අභිෂේකය, පණ්ඩුවාසදේව රජුගේ අභිෂේකය, අභය රජුගේ අභිෂේකය, දේවානම්පියතිස්ස රජතුමාගේ රාජ්‍ය කාලය, මහින්දාගමනය, මහාවිහාරය කරවීම, චෛත්‍ය ඉදිකිරීම, ධාතු ආගමනය, මහාබෝධි ආගමනය, මහින්ද තෙරුන්ගේ පරිනිර්වාණය, ගාමිණී කුමාරයාගේ චරිතය, ළමා කාලය රජවීම දෙමළුන් නැසීම, වෙහෙර විහාර කරවීම හා පාලන සමය ආදි තොරතුරු හා පශ්චාත් කාලීන මහසෙන් රාජ්‍ය සමය දක්වා තොරතුරු අඩංගු වේ.

5. බුදුරදුන්ගේ ශාරීරික ධාතු වස්තු විෂයය කොට රචිත වංසකථා නම් කරන්න.

- දාඨාවංසය - වම් දළදාව
- ලලාටධාතු වංශය - ලලාට ධාතුව

6. පාලි වංසකථා රචනා කිරීමේ අරමුණු කෙටියෙන් ලියන්න.

- පූජාර්හ වස්තු වර්ණනය පිණිස
- ඉතිහාස කරුණු දැක්වීම පිණිස
- බුද්ධ ගෞරවය ඇති කිරීම පිණිස
- ශාසනික තොරතුරු ජනගත කිරීම
- රචනා කෞශල්‍ය ප්‍රතීයමාන කිරීම

7. මහාවංසයේ ඇතුළත් මහාකාව්‍ය ලක්ෂණ පහක් දක්වන්න.

- පරිච්ඡේදවලින් යුතු වීම
- ධීර වීර නායක චරිත වර්ණනා කිරීම
- නමස්කාරයකින් යුක්ත වීම
- ශාන්ත රසය ආදි රස නිපැදීම

WWW.PIRIVENA.LK

- පරිච්ඡේද ප්‍රමාණය ප්‍රමාණවත් වීම
- විවාහ, යුද්ධ ජය ආදි දෑ තිබීම

8. මහාවංසය කාව්‍ය ග්‍රන්ථයකට වඩා ඉතිහාස කෘතියක් බව තහවුරු කෙරෙන හේතු සාධක දෙකක් ලියන්න.

- රාජ්‍ය පාලන තොරතුරු ක්‍රමානුකූල ව අන්තර්ගත කර තිබීම
- ඒ ඒ කාලවල දී සිදු වූ සුවිශේෂ කරුණු අන්තර්ගත කර තිබීම
- ජාතික ආගමික ආර්ථික ආදි තොරතුරු ගැබ් වී තිබීම

9. මහාවංසයේ 6 පරිච්ඡේදයෙන් උකහා ගත හැකි සාරධර්ම කීපයක් ලියන්න.

- සත්‍යවාදී වීම (මව දරුවන්ට සත්‍යය ම කීම - දෙමාපියන්ගේ ශාරීරික වෙනස ගැන දරුවන් ඇසූ විට)
- අසරණ වූ අවස්ථාවල පිහිට වීම (ඥාතීන් සොයා එන ගමනේ සෙන්පතියා ඔවුනට වස්ත්‍ර දීම)
- තම පියා නැසීමට යෑමට සැරසෙන පුතුන් දෙවරක් ඉන් වැළැක්වීම
- අවැඩක් සිදු කරන කල්හි ඉන් මිදවීම සඳහා අනුශාසනා කිරීම
- වැරදිකරුවන්ට නිසි දඬුවම් ලබා දීම

10. සිංහබාහු කුමාරයා සිංහ රජුට හීය විදින අවස්ථාවේ සිංහ රජුට ඇති වෙන්නට ඇතැයි සිතිය හැකි සිතිවිලි උපකල්පනය කොට ලියන්න.

උක්ත අදහස ඔබම සිතා ලියන්නේ නම් වටී. එබැවින් පිළිතුරක් මෙහි සටහන් නොවේ.

WWW.PIRIVENA.LK

සටහන්

....

....

....

....

....

....

....

....

....

....

WWW.PIRIVENA.LK